(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 9]

# පාර්ලිමේන්තුවේ
# න්‍යාය පුස්තකය

**2013 ජූලි මස 23 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2013 ජූලි මස 12 වැනි සිකුරාදා**

## 2013 ජූලි මස 23 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2443/'12

1.
ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිල්වලා ගඟ ව්‍යාපාරයේ පළමු අදියරට ඇතුළත් වූ කිරල කැලේ ප්‍රදේශයේ තෙත් බිම් හෙක්ටයාර් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ පිටාර ගැලීම වැළැක්වීම සඳහා කිරල කැලේ හා අවට ප්‍රදේශවල වැසි ජලය නිරන්තරයෙන් පොම්ප කිරීමක් සිදුවන බවත්;

(ii) එකී තත්ත්වය නිසා එම ප්‍රදේශවල භූගත ජල ප්‍රමාණය අඩුවී පසට ලවණ ජලය කාන්දුවීමක් සිදුවන බවත්;

(iii) එමගින් ඇතිවන පරිසර තත්ත්වය හේතුවෙන් කිරල කැලේ තෙත් බිම ආශ්‍රිත කුඹුරු පුරන්වී එම ගොවි ජනතාවගේ ජීවන මාර්ග අවහිරවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත (ආ)(iii) හි සඳහන් ගැටලුකාරී තත්ත්වය වෙනස්කර ගැනීම සඳහා කද්දුව ජල පොම්පාගාරයට පහළින් අමුණක් තනා කිරල කැලේ ප්‍රදේශයට ජලය සැපයීමේ සැලසුමක් පවතින්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2584/'12

2.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලිය නොමැති ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී නැගෙනහිර පළාතේ විදුලිය නොමැති සියලුම ගම්මානවලට විදුලිය ලබාදීමේ හැකියාවක් තිබුණේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2875/'12

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවේ ආහාර සඳහා මස් වර්ග ලබා දුන් සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) යුද හමුදාව සඳහා මස් සැපයුම්කරුවන් තෝරා ගන්නා ආකාරය කවරේද;

(iii) එම කාලය තුළ එක් එක් මස් වර්ගය සඳහා වාර්ෂිකව ගෙවන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ සඳහා තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) ඉහත සඳහන් මස් වර්ගවල එක් කිලෝවක් සඳහා වාර්ෂිකව ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම එක් එක් මස් වර්ගයේ වාර්ෂික අවශ්‍යතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2890/'12

4\.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ලොවපුරා සේවය කරන නිර්වේතනික කොන්සල්වරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවය කරන රටවල් සමගින් ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් එසේ කටයුතු කර ඇති කාලපරිච්ඡේදය කොපමණද;

(iv) ඔවුන් පත්කිරීමේදී යොදාගන්නා ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1948 වර්ෂයේ සිට අද දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව විසින් පත් කරන ලද යම් නිර්වේතනික කොන්සල්වරයෙකු ඉවත්කර තිබේද;

(ii) එසේ නම්, එම කොන්සල්වරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2999/'12

5\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වයඹ පළාතෙහි 2012 වර්ෂය අවසන් වනවිට වාර්තාවී ඇති,

(i) සමස්ත තැලසීමියා රෝගීන් සංඛ්‍යාව;

(ii) තැලසීමියා රෝගීන් අතර සිටින පාසල් ළමුන් සංඛ්‍යාව;

(iii) එම පාසල් ළමුන් අතරින් අවුරුදු 15ට අඩු තැලසීමියා රෝගී දරුවන් සංඛ්‍යාව;

(iv) අවුරුදු 15ට වැඩි තැලසීමියා රෝගීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැලසීමියා රෝගය වයඹ පළාත හැරුණු විට වෙනත් පළාත්වල ව්‍යාප්තව තිබේද;

(ii) එසේ නම්, වාර්තා වී ඇති සමස්ත තැලසීමියා රෝගීන් සංඛ්‍යාව පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) තැලසීමියා රෝගීන් වෙනුවෙන් විශේෂ සුභසාධන වැඩසටහන් දියත්කර තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) තැලසීමියා රෝගය තුරන් කිරීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3254/'12

6.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ලැප්ටොප් පරිගණක ලබාදුන් ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජනමාධ්‍යවේදීන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ලැප්ටොප් පරිගණක ලබාදීමට ජනමාධ්‍යවේදීන් තෝරා ගන්නා පදනම කවරේද;

(iv) එම එක් පරිගණකයක මිල කොපමණද;

(v) මේ දක්වා බෙදා දී ඇති ලැප්ටොප් පරිගණක සඳහා වැයකර ඇති සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3597/'13

7.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත ආයුර්වේද උපාධිධාරීන් සියලුම දෙනාට රැකියා ලබාදීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

(ii) අවසන්වරට ආයුර්වේද උපාධිධාරීන්ට රජයේ පත්වීම් ලබාදුන් වර්ෂය කවරේද;

(iii) එම අවස්ථාවේදී පත්වීම් ලබාදුන් ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියකු බිහිකිරීම සඳහා රජය වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් වසා ඇති බෙහෙත්ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම බෙහෙත්ශාලා සඳහා ආයුර්වේද වෛද්‍යවරු අනුයුක්ත කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3632/'13

8.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් අධ්‍යාපන කොට්ඨාසයට අයත් පාසල්වල ගුරු හිඟයක් පවතින බවත්;

(ii) මේ හේතුවෙන් සිසුන්ගේ අධ්‍යාපන මට්ටම පහළ යන බවට දෙමාපියන් හා ආදි සිසුන් අධ්‍යාපන නිලධාරීන්ගේ අවධානයට යොමු කොට ඇති අතර මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් සභාවේ ද සාකච්ඡා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සිසුන්ගේ අනාගත අධ්‍යාපන සුභසිද්ධිය සැලකිල්ලට ගෙන එම ප්‍රදේශයේ පාසල්වල පවතින ගුරු හිඟය මගහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3634/'13

9.
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාගම්පුර, මහින්ද රාජපක්ෂ වරායේ තෙල් ගබඩාකිරීමේ ටැංකි ඉදිකිරීමට අදාළව,

(i) ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ අවසන් සමස්ත පිරිවැය කොපමණද;

(ii) එකී ව්‍යාපෘති පිරිවැය සඳහා අරමුදල් සපයාගත් ආකාරය කවරේද;

(iii) ණය පහසුකම් ලබාගෙන තිබේ නම්, එම ණය පහසුකම්වලට අදාළ කොන්දේසි කවරේද;

(iv) මූල්‍ය ගාස්තු හා ණය පොලී ගෙවීමෙන් ද අනතුරුව එකී ව්‍යාපෘතිය මුදල් ප්‍රවාහ සමායනයක් අත් කරගන්නේ කවර දිනකද;

(v) එම එක් එක් ටැංකියේ ධාරිතාව කොපමණද;

(vi) එක් එක් ටැංකියේ ඉදිකිරීම් අවසන් කළ දිනයන් හෝ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තෙල්නැව්වලින් ගෙන ඒමට අපේක්ෂා කරන නාවික යාත්‍රා ඉන්ධන, ගුවන්යානා ඉන්ධන සහ "එල්.පී. ගෑස්" එම නැව්වලින් ගොඩ බා, ගබඩා කර ගැනීම සඳහා අවශ්‍ය කරන ටැංකි සංඛ්‍යාව කවරේද;

(ii) අද දක්වා එකී වරායට පැමිණ, ඉහත කී ඉන්ධන වර්ග ගොඩබා ඇති තෙල් නැව් සංඛ්‍යාව කොපමණද;

(iii) මුල් ව්‍යාපෘති වාර්තාවට අනුව එකී වරායට වර්ෂයකට පැමිණීමට අපේක්ෂිත තෙල් නැව් සංඛ්‍යාව සහ මාසයකට ගොඩබෑමට අපේක්ෂිත ඉහත කී ඉන්ධන වර්ග ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3646/'13

10.
ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය තුළ ලංකා බැංකුව විසින් කොළඹ කොටස් හුවමාරුවෙහි කොටස්වල ආයෝජනය කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2011 වර්ෂය තුළදී ලංකා බැංකුව විසින් "පර්පෙචුවල් කැපිටල් " (Perpetual Capital) සහ "සී/ස ලංකා ඔරික්ස් ලීසිං සිකියුරිටීස්" (Lanka Orix Leasing Securities Ltd.) යන සමාගම් සමග සිදුකරන ලද ව්‍යාපාර කටයුතුවල වටිනාකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2011 වර්ෂය තුළ ලංකා බැංකුව විසින් මිලදී ගන්නා ලද සියලුම කොටස්වල ලැයිස්තුවක්, ඒවා ගත් මිල සහ මිලදී ගැනීම සිදු කළ දිනවලට ආසන්න පූර්ව දින පහ තුළ සාමාන්‍ය බර තැබූ මිල ද ඇතුළත්ව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3657/'13

11.
ගරු වසන්ත අලුවිහාරේ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කටුදෙණිය, වාරියපොල ග්‍රාමයන්ට පිවිසෙන මාර්ගය, A-9 මාර්ගයට යා කෙරෙන ස්ථානයේ ඇති පටු පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළද, මේ වන විට එම ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නව පාලම ඉදිකිරීම ආරම්භ කිරීමට පදනම් කර ගත් මුලා ප්‍රතිපාදනය කවරේද;

(ii) ඇස්තමේන්තු අනුව පාලම ඉදිකිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) පාලමේ වැඩ කටයුතු ආරම්භ කළ දිනය හා නිම කිරීමට නියමිතව තිබූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමඟදී අත්හිටුවීමට හේතු කවරේද;

(ii) මෙතෙක් කර ඇති ඉදි කිරීම් වෙනුවෙන් වැය කර ඇති මුදල කොපමණද;

(iii) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2585/'12

12.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ එක් පවුලකට මාසයක් ජීවත්වීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එක් පවුලකට එක් මාසයකදී ආහාර සඳහා සහ ආහාර නොවන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් පවුලකට ජීවත්වීම සඳහා මාසිකව අවශ්‍ය මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සාමාජිකයින් තුන් දෙනෙකු සහිත පවුලකට මාසයක් ජීවත්වීම සඳහා රු 7500.00 ක මුදලක් ප්‍රමාණවත් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2710/'12

13\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාවට අයත් සී. ටී. සී. තේ කම්හලෙන් 2012. 01. 26 දින තේ පිරවූ බෑග් 240 ක් කොළඹට ප්‍රවාහනය කිරීම සඳහා අංක SP KL-5432 දරන ලොරි රථයට පටවා ඇති බවත්;

(ii) එම තේ බෑග් ප්‍රමාණය පැටවූ බවට කම්හලේ අධිකාරී සහ ලොරි රියදුරු විසින් තේ නිකුත් කරන ලද පොතෙහි අත්සන් තබා ඇති බවත්;

(iii) එම තේ බෑග් 240 න් තේ මිලදී ගන්නා ස්ථානයට අලෙවි කර ඇත්තේ බෑග් 200 ක් පමණක් බවත්;

(iv) කම්හල් ලේඛනවල 240 ක් ලෙස සටහන්ව තිබූ තේ බෑග් සංඛ්‍යාව පසුව 200 ක් ලෙස වෙනස්කර ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) කළුබෝවිටියන සී. ටී. සී. තේ කම්හලේ සිදුවී ඇති ඉහත සඳහන් වංචාව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2876/'12

14\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු භටයින්හට ලබාදෙන වැටුප් සහ දීමනා කවරේද;

(ii) ඔවුන්ගේ වැටුපෙන් මාසිකව සිදුකරන අයකිරීම් කවරේද;

(iii) එම අයකිරීම් අරමුදලක් වෙත බැර කරන්නේද;

(iv) එසේ නම්, එකී අරමුදල ගිණුම්ගත කර ඇති ආයතනය කවරේද;

(v) එවැනි අයකිරීම් සිදුකිරීමට හේතු කවරේද;

(vi) ආපසු ඔවුන් වෙත ලබාදෙන අයකිරීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිවිල් ආරක්ෂක භටයින්ගේ වැටුප් නියමිත දිනයේ දී ගෙවා තිබේද;

(ii) එසේ නොමැති නම්, ඔවුන්ට ගෙවීමට ඇති හිඟ මුදල කොපමණද;

(iii) එම හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සිවිල් ආරක්ෂක භටයින් යොදා ගනිමින් වර්තමානයේ සිදුකරන ක්‍රියාකාරකම් කවරේද;

(ii) වගා කටයුතු සහ අනෙකුත් කර්මාන්ත සඳහා ඔවුන් යොදාගෙන තිබේද;

(iii) ඒ සඳහා ඔවුන්ට ලබාදෙන පහසුකම් කවරේද;

(iv) එම ක්‍රියාකාරකම් තුළින් වාර්ෂිකව ඔවුන් උපයාදෙන මුදල කොපමණද;

(v) එම මුදල් යොදා ගන්නා කටයුතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2891/'12

15.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටට ලැබෙන සියලු විදේශ ණය සහ ප්‍රදාන සඳහා වගකීම දරන්නේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ 3 තුළදී ඉහත කී දෙපාර්තමේන්තුව හරහා රටට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එක් එක් රට විසින් පසුගිය වර්ෂ 5 සඳහා ලබාදීමට පොරොන්දු වූ මුදල සහ ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (ii) අනුව ලැබුණු මුදල් උපයෝගිතා අනුපාතය, වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 10 තුළ විදේශ රටවලින් සහ බහු පාර්ශ්වීය නියෝජිත ආයතන විසින් ලබාදුන් මුළු මුදල් ප්‍රමාණයෙන්,

(i) ප්‍රයෝජනයට නොගත් මුදල් ප්‍රමාණයන් කොපමණද;

(ii) එකී මුදල් ප්‍රමාණය ප්‍රයෝජනයට නොගැනීමේ හේතු කවරේද;

යන්නත් වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2013.06.18 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර 2013 ජනවාරි මස 22 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 08 දිනැති අංක 1787/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 පෙබරවාරි 08 දිනැති අංක 1796/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2013 මැයි 10 දිනැති අංක 1809/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22(1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 03 දිනැති අංක 1808/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 ජුනි 07 දිනැති අංක 1813/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2013 ජුනි 20 දිනැති අංක 1815/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ධසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ධසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 මාර්තු 01 දිනැති අංක 1799/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.03.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

18.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

21.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

22.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 ජූලි මස 24 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2459/'12

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින් 1890 දී ආරම්භ කළ මහනුවර ශ්‍රී රාහුල විද්‍යාලයට අනුබද්ධව පේෂකර්ම පාසලක් පවත්වාගෙන ගොස් ඇති බවත්;

(ii) වර්ෂ 1962 දී ඉහත පාසල රජයට පවරා ගැනීමෙන් පසුව එහි පේෂකර්ම පාසලේ සේවය කළ ඊ. කැකුළාවල නමැත්තියට පාසලෙහි දේපළවලින් ඉවත්වන ලෙස මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අංක මපා/රා.ප.ව./293 දරන 1965.07.26 දිනැති ලිපියෙන් දන්වා තිබූ බවත්;

(iii) කැකුළාවල නමැත්තිය ඒ අනුව කටයුතු නොකළ අතර ඇයගෙන් පසුව එම්. ජේ. මෙන්ඩිස් නමැත්තෙකු එහි අනවසරයෙන් පදිංචිව සිටින බවත්;

(iv) ඔහුට එරෙහිව මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් පැවරූ අංක 75269 දරන නඩුවේ 1988.03.08 දිනැති තීන්දුව මගින් පාසල් භූමියෙන් ඉවත්වන ලෙස කර ඇති නියෝගය අනුව ඔහු මෙතෙක් කටයුතු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල් භූමිය තුළ අනවසර පදිංචිකරුවකු සිටීම පාසල් පරිපාලනයට විශාල බාධාවක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, අධිකරණ තීන්දුව අනුව හෝ වෙනත් නීත්‍යානුකූල ක්‍රමවේදයන් මගින් ඔහු ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2586/'12

2\. ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවත් ඇමෙරිකා එක්සත් ජනපදයත් අතර තිබෙන වෙළඳ සබඳතාවයේ ස්වභාවය කවරේද;

(ii) ඇමෙරිකා එක්සත් ජනපදය සමග ඇති වෙළඳ සබඳතාව අප රටට කෙතරම් වැදගත් වන්නේද;

(iii) අද වනවිට දෙරට අතර ආනයන සහ අපනයන ප්‍රමාණයන් රුපියල් මිලියනවලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ නිෂ්පාදිත භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ වර්ජනය කිරීමේ වැයමක් තිබේද;

(ii) එසේ නම්, එවැනි වර්ජනයකින් ශ්‍රී ලංකාවට ඇතිවන බලපෑම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2877/'12

3\. ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 කාල්ටන් රග්බි තරඟාවලිය පැවැත් වූ දිනයන් කවරේද;

(ii) එය පැවති ක්‍රීඩාංගන කවරේද;

(iii) ඒ සඳහා ඉදිරිපත් වූ ක්‍රීඩා කණ්ඩායම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත රග්බි තරඟාවලිය සඳහා සහභාගී වූ විදේශීය ක්‍රීඩකයින් කවුරුන්ද;

(ii) එම එක් එක් ක්‍රීඩකයාට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඊට සහභාගි වූ දේශීය ක්‍රීඩකයින් කවුරුන්ද;

(iv) එම එක් එක් ක්‍රීඩකයාට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාල්ටන් රග්බි තරඟාවලියේ සංවිධායකයින් කවුරුන්ද;

(ii) එම තරඟාවලියේ දේශීය හා විදේශීය අනුග්‍රාහකයින් කවුරුන්ද;

(iii) එම එක් එක් අනුග්‍රාහකයින් ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී තරඟ විකාශනය කරන ලද රූපවාහිනී නාලිකාව කවරේද;

(v) එම තරඟාවලිය ප්‍රචාරය සඳහා ගිය වියදම කොපමණද;

(vi) ප්‍රචාරක අනුග්‍රාහකත්වය දැරූ ආයතන කවරේද;

(vii) ඒ සඳහා එම ආයතන ලබා දුන් මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2892/'12

4.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ වියදම, විනිවිදභාවය මත පදනම්ව අමාත්‍යාංශය විසින් නිරීක්ෂණය හෝ පාලනය කරනු ලබන්නේ කවර ආකාරයටද;

(ii) අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ සංස්ථාවල වියදම් සීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩර් සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමිති නියම කිරීම සහ යාවත්කාලීන කිරීම භාරව සිටින්නේ කවුරුන්ද;

(ii) ඉහත කී ප්‍රමිති අවසන්වරට යාවත්කාලීන කරන ලද දිනය සහ නැවත යාවත්කාලීන කරනු ලබන දිනය කවරේද;

(iii) කැබිනට් අමාත්‍යවරයෙකුට, අමාත්‍යාංශයකට, දෙපාර්තමේන්තුවකට සහ සංස්ථාවකට අනුමත කළ හැකි ටෙන්ඩර් සීමාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ටෙන්ඩර් සම්බන්ධයෙන් පැනනැගිය හැකි යම් දූෂණයක් පිළිබඳව වගකීම දැරිය යුතු පුද්ගලයා හෝ ආයතනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3071/'12

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දකුණු පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) දකුණු පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3196/'12

6.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී සෞදි අරාබියේ ගෘහ සේවිකාවන් වශයෙන් සහ වෙනත් රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් සහ පිරිමින් විශාල සංඛ්‍යාවක් ඉතා දුක් විඳිමින් දැනට එම රටේ "ඔලායා" රැඳවුම් කඳවුරේ සහ "ජෙඩා" පාලම යට රැඳී සිටින බවත්;

(ii) අදාළ ගිවිසුම් පරිදි සුදුසු රැකියා ස්ථාන නොලැබීම, හිංසනය සහ වැටුප් නොගෙවීම වැනි විවිධ කරුණු ඒ සඳහා හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ශ්‍රී ලාංකික පිරිස වහාම මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව, සුභසාධනය සහ ආර්ථිකය නංවාලීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි, ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3257/'12

7.

ගරු රෝසි සේනානායක මහත්මිය,— නැවත පදිංචිකිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවතැන් කඳවුරුවල සිටි ජනතාව මුලතිව් දිස්ත්‍රික්කයේ, ඕලුමඩු ගම්මානයේ නැවත පදිංචි කරවන ලද දිනය කවරේද;

(ii) එම ගම්මානයේ පදිංචි කරවන ලද පවුල් සංඛ්‍යාව සහ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කරවූවන් සඳහා නිවාස ඉදිකර ගැනීමට ලබාදී ඇති ද්‍රව්‍යමය හා මූල්‍යමය ආධාර කවරේද;

(iv) මෙම ගම්මානයට ලබාදී ඇති අනෙකුත් පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඕලුමඩු ගම්මානයේ සිටින,

(i) සිංහල, දෙමළ සහ මුස්ලිම් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) වැන්දඹු කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් පාදයක් අහිමි පිරිමි සංඛ්‍යාව කොපමණද;

(iv) මව සහ පියා අහිමි දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3678/'13

8\.
ගරු වික්ටර් ඇන්ටනි මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විටින් විට ඇතිවන විවිධ දේශගුණික තත්ත්වයන්ට සහ දැඩි නියඟයට ඔරොත්තු දීමට හැකි පොල් ප්‍රභේද හඳුනාගෙන තිබේද;

(ii) ඒ සම්බන්ධයෙන් සිදු කළ අත්හදා බැලීම්වල සාර්ථක අසාර්ථකභාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3681/'13

9\.
ගරු නිමල් විජේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සරුසාර පොල් ඉඩම් කට්ටි කර වෙන්දේසි කිරීම දේශීය පොල් නිෂ්පාදනය අඩුවීමට හා පොල් මිල වරින්වර ඉහළ යාමට හේතුවී ඇති බැවින් එම තත්ත්වය අවම කරලීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) කුඩා පොල් වතු හිමියන් දිරි ගැන්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) පොල් සහනාධාරය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) අලුතින් පොල් වගාව ආරම්භ කරන කුඩා වතු හිමියන්ට ලබාදෙන සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3771/'13

10\.
ගරු විජිත බේරුගොඩ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් වර්ෂ 2005 සිට මේ දක්වා වූ කාලය තුළ,

(i) ජාතික ආර්ථිකයට ලබාදුන් දායකත්වය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නව ප්‍රවනතා සහ සංවර්ධන කටයුතු ඉලක්ක කර ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන් කවරේද;

(iii) බැංකුව තම ශාඛා ජාලයේ සිදු කළ ව්‍යාප්තිය කවරේද;

(iv) උතුරු නැගෙනහිර සංවර්ධන කටයුතුවලට දැක්වූ දායකත්වය කවරේද;

(v) ආසන්න සමාජ වගකීම සම්බන්ධයෙන් ඉටු කරන ලද ක්‍රියාකාරකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3870/'13

11\.

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගා කිරීමේ මණ්ඩලයේ ව්‍යාපෘතියක් වන කප්රුක පුරවර වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන පැළ තවාන් සඳහා බීජ පොල් ලබා ගන්නා ආකාරය කවරේද;

(ii) බීජ පොල් ලබා ගැනීම සඳහා විශේෂිත පොල්ගස් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ගස් හඳුනාගැනීම සිදුකළ අය කවුරුන්ද;

(iv) මේ වන විට හඳුනාගෙන ඇති බීජ පොල් ලබාගන්නා ගස් සංඛ්‍යාව කොපමණද;

(v) කප්රුක පුරවර වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන පොල් පැළ තවාන්වල මේ වන විට තවාන් කර ඇති බීජ පොල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම එක් එක් බීජ පොල් පැළ තවාන පිහිටා ඇති ස්ථාන කවරේද; සහ

(vii) එම තවාන්වලින් ලබාගන්නා, වගා කිරීමට සුදුසු තත්ත්වයේ ඇති පොල් පැළ සම්බන්ධයෙන් ගනු ලබන ඊළඟ පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2587/'12

12\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට එකඟ වී ඇති ජාත්‍යන්තර මානව හිමිකම් එකඟතාවන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එකඟතාවන්,

(i) ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටින්නේද;

(ii) රට තුළ බලගැන්වීමට අවශ්‍ය නීති සම්පාදනය කර තිබේද;

(iii) ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රටට ඇතිවන අහිතකර බලපෑම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) මානව අයිතිවාසිකම් සුරක්ෂා කිරීම පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද ?

2712/'12

13\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, වේරගම්පිට, තොටුපොල පාර, රත්ගම්වත්තේ පදිංචි පී. ජී. එස්. කේ. වික්‍රමනායක මහතා ඇතුළු දුම්රිය දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් 16 දෙනෙකු අංක HRC / 6061, 6081, 6083, 6099, 6163, 6214, 6214, 6306 සහ 06B යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළ බවත්;

(ii) ඔවුන්ට සහන සැලසෙන නිර්දේශයක් මානව හිමිකම් කොමිසම විසින් 2007.07.16 දින ලබාදුන් බවත්,

(iii) එම නිර්දේශය මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මානව හිමිකම් කොමිසම ලබාදෙන ලද එම නිර්දේශයන් මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එම නිර්දේශ ක්‍රියාත්මක කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2878/'12

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොබිටෙල් ආයතනයේ රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයතනයේ ටෙලිකොම් සමාගමට අයත් කොටස් ප්‍රමාණය කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා මොබිටෙල් ආයතනය ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iv) එම ආයතනයේ දැන්වීම් ප්‍රචාරය සඳහා 2010 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව වැයකරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මොබිටෙල් ආයතනය විසින් ක්‍රීඩා හෝ අනෙකුත් කටයුතු සඳහා අනුග්‍රාහකත්වය ලබා දී ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් කරුණ සඳහා වැයකරන ලද මුදල සහ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉදිරියේ දී අනුග්‍රාහකත්වය ලබා දීම සඳහා ගිවිසුම්ගතව ඇති ආයතන කවරේද;

(iv) එම එක් එක් ආයතනය සඳහා වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මොබිටෙල් ආයතනයේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ මාසික වැටුප සහ දීමනාවල අගයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම තනතුරුවලට ඔවුන් පත්කරනු ලබන බලධාරීන් කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2893/'12

15.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන් කවුරුන්ද;

(ii) ඉහත සඳහන් නිලධාරීන්ගේ නම්, නිපුණතා, සුදුසුකම් සහ වයස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි සංවිධාන සැලැස්ම කවරේද;

(iv) අමාත්‍යාංශයෙහි උසස්වීම් ප්‍රදානය කරනු ලබන ආකාරය කවරේද;

(v) දේශපාලනීකරණයට අවනත නොවීම හේතුවෙන් අසාධාරණයට ලක්වූ යම් නිලධාරීන් සිටීද;

(vi) එසේ නම්, එම අසාධාරණයෙහි ස්වභාවය කවරේද;

(vii) අගතියට පත් පාර්ශ්වයට ලබාගත හැකි සහනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූලි මස 25 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2588/'12

1\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට,

(i) වාර්ෂිකව ලැබුණු විදේශ ආධාර ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වැඩිම ද්විපාර්ශ්වික ආධාර ලබාදෙන ප්‍රධාන රටවල් දහය (10) කවරේද;

(iii) ද්විපාර්ශ්වික ආධාර ලබාදුන් ඉහත එක් එක් රට ලබා දී ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බහුපාර්ශ්වික ආධාර ලබාදුන් රටවල් සහ ජාත්‍යන්තර ආයතන කවරේද;

(v) බහුපාර්ශ්වික ආධාර වැඩියෙන්ම ලබා දී ඇති රටවල් හෝ ආයතන 10 ලබා දී ඇති ආධාරවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවට විදේශ ආධාර ලබාගැනීම සඳහා අනුගමනය කරන්නා වූ උපායමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2879/'12

2\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂයේ පොසොන් උත්සවය නිමිත්තෙන් කොළඹ ජාතික කෞතුකාගාරය කේන්ද්‍රකරගනිමින් ඩිජිටල් තාක්ෂණය භාවිතාකර යම් ආගමික වැඩ සටහනක් සකස්කර තිබුණේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම වැඩසටහන ඉදිරිපත් කිරීමට,

(i) අදාළ අනුමතිය ලබාදුන් අය කවුරුන්ද;

(ii) යොදාගත් නම කවරේද;

(iii) අදාළ අරමුණ කවරේද;

(iv) කටයුතුකළ ආයතනය කවරේද;

(v) වැය වූ සමස්ත වියදම කොපමණද;

(vi) වැයකළ වියදම් ආවරණය කිරීම සඳහා අනුග්‍රහය ලබාදුන් ආයතනය හෝ ආයතන කවරේද;

(vii) අනුග්‍රහය ලබාදුන් ආයතනය හෝ ආයතන විසින් ලබාදුන් මුදල හෝ මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2894/'12

3.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1950, 1960, 1970, 1980, 1990, 2000, 2005, 2006, 2007, 2008, 2009, 2010, 2011 සහ 2012 යන මූල්‍ය වර්ෂයන් අවසානයේදී,

(i) වාර්ෂික රාජ්‍ය ආදායම කොපමණද;

(ii) වාර්ෂික රාජ්‍ය ආදායම සහ වියදම අතර සංසන්දනාත්මක වෙනස කවරේද;

(iii) දළ දේශීය නිෂ්පාදිතය (GDP) කොපමණද;

(iv) (අ)(ii) හි සඳහන් කරන ලද වෙනස අදාළ වර්ෂයෙහි දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ඒක පුද්ගල ණය ප්‍රමාණය කොපමණද;

(vi) ඒක පුද්ගල ණය ප්‍රමාණයෙහි සංසන්දනය රුපියල්වලින් සහ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්වලින් කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2920/'12

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි වලස්මුල්ල රෝහල අවට ගම්මාන රාශියක රෝගී ජනතාවට සෞඛ්‍ය සේවාවන් සපයනු ලැබූ රෝහලක් බවත්;

(ii) මේ වන විට එම රෝහලෙහි වෛද්‍යවරුන්ගේ දැඩි හිඟයක් පවතින බවත්;

(iii) රෝහලෙහි ලේ බැංකුවේ කටයුතු සහ මෘත ශරීරාගාරයේ මිනී කැපීමේ කටයුතු සිදු නොවන බවත්;

(iv) එම රෝහලෙහි කිසිදු වාට්ටුවකට නේවාසික රෝගීන් ඇතුළත් කර නොගන්නා බවත්;

(v) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වලස්මුල්ල නගරයෙන් ඉවත් කිරීමට සැලසුම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වලස්මුල්ල රෝහලෙහි පවතින මානව හා භෞතික සම්පත් හිඟය කඩිනමින් මගහැරවීමට කටයුතු කරන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3072/'12

5\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) නැගෙනහිර පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3266/'12

6\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හෝමාගම, පාදුක්ක සහ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සමහර ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාම නිලධාරීන් සේවයේ යොදවා නොමැතිවීම නිසා ඒ ඒ ප්‍රදේශයන්හි ගම්වාසීහු දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,

(i) දැනට සේවය කරනු ලබන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරී වසම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3683/'13

7\.

ගරු නිමල් විජේසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක කළ තිරසාර කෘෂිකර්ම ජල කළමනාකරණ ව්‍යාපෘති අදියර I හා II හි අරමුණු කවරේද;

(ii) එම අරමුණු ළඟා කර ගැනීම සඳහා මෙතෙක් දරා ඇති ප්‍රයත්නයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද වගා ව්‍යාපෘතීන්හි වර්තමාන තත්ත්වයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීමේ වැඩසටහන් තුළින් මෙතෙක් දරා ඇති ප්‍රයත්නයන් කවරේද;

(ii) ඊට අදාළව ඉදිරියේ ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3773/'13

8.

ගරු විජිත බේරුගොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ 'කෘෂි නිෂ්පාදනය සඳහා අගය එකතු කිරීම සහ සැපයුම් දාමය තුළ පසු අස්වනු හානිය අවම කිරීම තුළින් කෘෂි නිෂ්පාදනය සඳහා අලෙවිය ප්‍රවර්ධන කිරීම' යන වැඩසටහනෙහි අරමුණු කවරේද;

(ii) එම වැඩ සටහන යටතේ ඉටුකළ කාර්ය භාරය කවරේද;

(iii) ඉන් ජනතාවට ලැබී ඇති සහනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කෘෂිකාර්මික සංවර්ධනය සහ උන්නතිය උදෙසා ජාතික විශ්වවිද්‍යාල වෙතින් ලබා ගෙන ඇති සේවාවන් හා දායකත්වයන් කවරේද;

(ii) S. 2KR 2010—2012 වැඩසටහනින් අදහස් කරන්නේ කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3871/'13

9.

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ,

(i) වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ඉටු කරන ලද වැඩසටහන් කවරේද;

(ii) ඩී කොම් ආයතනයේ ක්‍රියාකාරීත්වය කවරේද;

(iii) ලංකා ධීවර සංස්ථාව මගින් ඉටු කරන ලද මහජන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ආයතන තුනෙහි අනාගත සංවර්ධන සැලසුම් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

2589/'12

10.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ධනවත්ම පුද්ගලයින්ගෙන් 20% ක් විසින් භුක්ති විඳින ජාතික ආදායමේ වටිනාකම;

(ii) ශ්‍රී ලංකාවේ දිළිඳුම පුද්ගලයින්ගෙන් 20% ක් විසින් භුක්ති විඳින ජාතික ආදායමේ වටිනාකම;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) හා (ii) හි පිළිතුරු අනුව ජාතික ආදායම බෙදී යෑමේ විෂමතාවයක් පවතින්නේ නම්, එය නිවැරදි කිරීමට රජය විසින් ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2895/'12

11.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයන් විසින් ප්‍රකාශ කොට ඇති ආකාරයට 2002 - 2003 වර්ෂයේදී පැවැති එක්සත් ජාතික පක්ෂ රජය විසින් ලබාදී තිබූ බදු නිදහස් කිරීම්වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් බිලියන 1000ක් තරම් විශාල වන්නේද;

(ii) නොඑසේ නම්, එහි නිවැරදි වටිනාකම කොපමණද;

(iii) ඉහත සඳහන් බදු නිදහස 2004 - 2005 කාලසීමාව තුළදී ඉවත් කරන ලද්දේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එක්සත් ජාතික පක්ෂ රජය විසින් ලබා දී තිබුණු බදු නිදහස වැරදි සහගත සහ නීතිවිරෝධී බවට 2004 රජය විසින් ඔප්පු කොට තිබුණේද;

(ii) එම බදු නිදහස ඉවත්කිරීමෙන් අනතුරුව රැස්කර ගනු ලැබූ බදුවල වටිනාකම මේ දක්වා, වාර්ෂික පදනමින් කොපමණද;

(iii) එවන් අඩු වටිනාකමක් සහිත බදු ප්‍රමාණයක් රැස්කර ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එක්සත් ජාතික පක්ෂ රජය විසින් හඳුන්වාදුන් බදු නිදහස් කිරීම් ඉතා අසුභවාදී ලෙස විවේචනයට ලක් කළ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය 2004 වර්ෂයෙන් පසුව එවන් බදු නිදහස් කිරීම් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය විසින් ලබා දී ඇති බදු නිදහස් කිරීම්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2921/'12

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෝට්ටගොඩ, බෙලිදෙණිය ප්‍රදේශයේ පිහිටි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අයත් ගොඩනැගිල්ල කිසිදු අයකිරීමකින් තොරව ජාතික ආධුනිකත්ව මණ්ඩලයට ලබාදුන් බවත්;

(ii) ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් 2011 ජූනි 25 දින එම ගොඩනැගිල්ලෙහි පාඨමාලා ආරම්භ කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ පාඨමාලා ඇරඹීම වෙනුවෙන් පැවති සමාරම්භක උළෙල සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම පුහුණු මධ්‍යස්ථානය, එය ආරම්භකළ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අයත් ගොඩනැගිල්ලෙන් ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) එම පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන නව ස්ථානය කවරේද;

(iv) එම ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන මාසික බදු කුලිය කොපමණද;

(v) එම ගොඩනැගිල්ලේ හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3020/'12

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 ජුලි මස අගදී ධාවනය කරමින් තිබූ දුම්රිය, එහි ගමනාන්තයට පෙර අතරමග නතරවීම් සිදුවී තිබේද;

(ii) එසේ නම්, අතරමඟ නතර වූ දුම්රිය සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් දුම්රිය අතරමඟ නතරවීම් කාර්මික දෝෂ හේතුවෙන් සිදුවී තිබේද;

(iv) ඉහත සඳහන් කාල සීමාව තුළ සිදුවූ දුම්රිය අතරමඟ නතරවීම් ඒවාට භාවිතා කළ ඉන්ධනවල තත්ත්වයන් හේතුවෙන් සිදුවී තිබේද;

(v) එසේ නම්, එම ඉන්ධන ලබාගත් ආයතනය කවරේද;

(vi) එම ආයතනය විසින් තත්ත්වයෙන් බාල ඉන්ධන ලබාදීම සම්බන්ධයෙන් ගත් පියවර කවරේද;

(vii) එකී තත්ත්වය මත දුම්රිය දෙපාර්තමේන්තුවට සිදු වූ සමස්ත පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3684/'13

14.

ගරු නිමල් විජේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස හලාවත වැවිලි සමාගම යටතේ පාලනය වන වතු කවරේද;

(ii) එම එක් එක් වත්තේ භූමි ප්‍රමාණය හා කරනු ලබන ප්‍රධාන වගාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ එක් එක් වත්තෙන් ලැබූ ආදායම සහ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3775/'13

15\.
ගරු විජිත බේරුගොඩ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හදිසි නීතිය යටතේ උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කරනු ලැබූ දිනය කවරේද;

(ii) එසේ ඒකාබද්ධ කිරීමට තුඩු දුන් හේතු කවරේද;

(iii) එසේ ඒකාබද්ධ කරන ලද උතුරු හා නැගෙනහිර පළාත්, පළාත් දෙකක් වශයෙන් නැවත ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනය කවරේද;

(iv) එම පළාත් වෙන් කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් පසුව සිදුකරනු ලැබුවේද;

(v) නොඑසේ නම්, එවැනි නඩු තීන්දුවක් ලැබීමට පෙර එසේ කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූලි මස 26 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2590/'12

1\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "එක ගමකට එක වැඩක්" යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මගින් ආවරණය වන ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන එක ගමක් වෙනුවෙන් වැයකරන මුළු මුදල කොපමණද;

(iv) දීප ව්‍යාප්තව ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් උක්ත ව්‍යාපෘතියේ නිශ්චිත ඉලක්කයන් ලහා කර ගැනීම වෙනුවෙන්ම යොමු කිරීම සඳහා සැකසූ සැලැස්ම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අපක්ෂපාතීව කටයුතු කිරීමට ගන්නා වූ පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2898/'12

2\.
ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 ජූලි 01 දින වනවිට,

(i) මෙරට පිහිටි පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලීසියේ සිටින පොලිස් කොස්තාපල්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොලිස් සේවය තුළ සිටින නියෝජ්‍ය පොලිස්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොලිස් කොස්තාපල්වරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2003, 2006 සහ 2009 වර්ෂවල ජූලි මස 01 දින වනවිට,

(i) ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ පොලිස් කොස්තාපල්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලීසියෙහි නියෝජ්‍ය පොලිස්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොලිස් කොස්තාපල්වරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2923/'12

3\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා එම අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාව වනවිට ධීවර සංස්ථාව ලාභ ලැබුවේද; නැතහොත්, පාඩු ලැබුවේද;

(ii) එම අවස්ථාවේදී ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

(iii) 2012.12.31 දිනට ධීවර සංස්ථාව ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ධීවර සංස්ථාවේ සේවය කරන තාවකාලික, අනියම් සහ ස්ථිර සේවකයින් හා නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009 වර්ෂයේ සිට මේ දක්වා විවෘත කරන ලද නව ධීවර වෙළඳසැල් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වෙළඳසැල් සඳහා පසුගිය වර්ෂ 3ක කාල සීමාව තුළ ගෙවන ලද මුළු කුලී මුදල කොපමණද;

(iv) එම ධීවර වෙළඳසැල්වල සේවය කරනු ලබන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනවිට ධීවර සංස්ථාව සතුව පවතින වත්කම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2982/'12

4\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගුරුවරුන්ගේ වෘත්තීය ගෞරවය රැකෙන පරිදි ජීවන වියදමට සරිලන ස්ථාවර වැටුප් ක්‍රමයක් සකස් කර නොමැති බවත්;

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වී ඇති පරිදි අතුරු වැටුප් යෝජනාව හිඟ වැටුප් සහිතව ලබාදීමට තවමත් නිසි ක්‍රමවේදයක් සකස් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අතුරු වැටුප් යෝජනාව හිඟ වැටුප් සහිතව ලබා දීමට මෙතෙක් නොහැකිවීමට හේතු කවරේද;

(ii) එම අතුරු වැටුප් යෝජනාවට අනුව ගුරුවරුන්ට හිමි විය යුතු මුළු හිඟ වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) වැටුප් ගැටලුවට අමතරව ගුරු-විදුහල්පති එකමුතුව විසින් කළ අනෙකුත් ඉල්ලීම් ඉටු කර දීමට කටයුතු කරන්නේද;

(iv) ගුරුවරුන් හා විදුහල්පතිවරුන් වෙනුවෙන් ස්ථාවර වැටුප් ක්‍රමයක් සකස් කර ඔවුන්ගේ වැටුප් ගෙවීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3021/'12

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 ජූලි මස අගදී සහ අගෝස්තු මස මුලදී මගී ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බස් රථවල හදිසි කාර්මික දෝෂ ඇති වූ බවට පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, ලැබී ඇති එම පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා අතුරින් ශ්‍රීලංගම බස් රථ සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් දෝෂ ඇතිවීමට හේතුව කවරේද;

(v) ඉහත (i) හි සඳහන් පරිදි ශ්‍රීලංගම බස්රථවල දෝෂ ඇතිවීම හේතුවෙන් ශ්‍රීලංගම ප්‍රවාහන සේවාවන්ට සිදුවූ පාඩුව කොපමණද;

(vi) එම පාඩු සිදුවීම සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3073/'12

6.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) බස්නාහිර පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මඟින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3256/'12

7.

ගරු පී. හැරිසන් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බන්ධනාගාර රැඳවියන් බැලීමට එන පුද්ගලයන් සහ බන්ධනාගාර නිලධාරීන් බන්ධනාගාරයට ඇතුල්වීමේදී පරීක්ෂාවට ලක්වන්නේද;

(ii) එසේ නම්, බන්ධනාගාර තුළට මත්ද්‍රව්‍ය සහ ජංගම දුරකථන රැගෙන එන අය කවුරුන්ද;

(iii) බන්ධනාගාර ඇතුළත සිදුවන අයථා සිදුවීම්වලට බන්ධනාගාර නිලධාරීන්ගෙන් සහයෝගය ලැබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැලිකඩ බන්ධනාගාරය තුළ ඉඩ පහසුකම් ලබා දිය හැකි රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට එම බන්ධනාගාරය තුළ රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3283/'12

8.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 1967.01.05 දිනට පෙර ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ (සංස්ථාවක් ලෙස ස්ථාපනය කිරීමට පෙර) අනියම් පදනම මත සේවයේ යෙදී සිටි කේ. ඒ. කරුණාසේන, එම්. ඩී. සී. පී. පෙරේරා, එල්. පී. කරුණාරත්න, ඊ. එම්. විමලසේන යන අයට විශ්‍රාම වැටුප් ලබානොදීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විමර්ශනය කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අංක HRC/5518/06/L-13 හා 2007.08.20 දිනැති නිර්දේශයන් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) අංක 17/2005 හා 2005.10.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත නම් සඳහන් අය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3290/'12

9.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ, මරදාන ප්‍රදේශයේ පිහිටි අල් අතීස් විදේශ රැකියා ආයතනය මගින් ඩබ්ලිව්. එම්. සුරේඛා ද සිල්වා යන තරුණිය රැකියාවක් සඳහා සෞදි අරාබියට යවා ඇති බවත්;

(ii) එහිදී ඇය මිය ගොස් ඇති බවත්;

(iii) ඇය විදේශගත කිරීමට එම විදේශ රැකියා ආයතනය ව්‍යාජ පොලිස් වාර්තා ඇතුළු ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාජ තොරතුරු මත ඉහත සඳහන් තරුණිය විදේශගත කිරීමට ක්‍රියා කළ එම ආයතනයට විරුද්ධව ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුරේඛා ද සිල්වා නමැත්තිය මියයාමට හේතුව මේ වන විට අනාවරණය කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම හේතුව කවරේද;

(iii) එම මරණයට අදාළ මරණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iv) මියගිය තරුණිය වෙනුවෙන් ඇයගේ දෙමාපියන්ට හිමිවිය යුතු වන්දි මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3685/'13

10.
ගරු නිමල් විජේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් පර්යේෂණ ආයතනයට අයත් පොල් වතු කවරේද;

(ii) එම එක් එක් වත්තට අදාළ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ එම එක් එක් වත්තේ පොල් ඵලදාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වත්තේ වියදම, ආදායම සහ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2591/'12

11.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිසම විසින් ඉදිරිපත් කරන ලද අන්තර්කාලීන නිර්දේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම නිර්දේශයන් ප්‍රසිද්ධියට පත් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විටත් ඉහත කොමිසම ඉදිරිපත් කළ අන්තර්කාලීන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට රජය සමත්වී තිබේද;

(ii) නොඑසේ නම්, මෙම අන්තර්කාලීන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න මෙම සභාවට එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

2902/'12

12.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි සංදේශ නියාමන කොමිසම ක්‍රියාත්මක වන්නේ කවර අමාත්‍යාංශයක් යටතේද;

(ii) විදුලි සංදේශ නියාමන කොමිසමේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම සහ 2006 සිට මේ දක්වා එහි එම තනතුර දැරූ අයගේ නම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂයේ සිට අද දින දක්වා, රූපවාහිනී නාලිකාවලට සංඛ්‍යාත වෙන්කරදීමෙන් ඉපැයූ ආදායම එක් එක් නාලිකාව අනුව, වාර්ෂික පදනමින් කොපමණද;

(ii) රූපවාහිනී නාලිකාවලට වෙන්කරන ලද ඇතැම් සංඛ්‍යාත ඉවත් කරගෙන, ඒවා යළි වෙනත් නව හෝ පැරණි රූපවාහිනී නාලිකා වෙත ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉහත කී පරිදි ඉහත සංඛ්‍යාත නැවත වෙන්කර දුන් සමාගම්වල නම් කවරේද;

(iv) එලෙස කලින් ඉවත් කරගත් සංඛ්‍යාත නැවත ලබාදීමෙන් උපයාගත් ආදායම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙලෙස රූපවාහිනී නාලිකාවන්ට සංඛ්‍යාත වෙන්කර දීම තුළින් ඉන්දියාව විශාල ප්‍රමාණයක ආදායමක් උපයන බවත්, ඉහත කී සංඛ්‍යාත වැරදි ලෙස වෙන්කරදීමේ විශාල පරිමානයේ ජාවාරමක් ඉන්දියාවේ ක්‍රියාත්මක වූ බවත් එතුමා දන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2924/'12

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පින්නවල අලි අනාථාගාරයට යාබදව සත්වෝද්‍යානයක් ඉදිකිරීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යෝජිත සත්වෝද්‍යානය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සපයා ගනු ලබන්නේ දේශීය අරමුදල්වලින්ද: නැතහොත්, විදේශීය අරමුදල්වලින්ද;

(ii) එම ප්‍රතිපාදන සපයා ගනු ලබන ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය ලබා දෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3022/'12

14.
ගරු දයාසිරි ජයසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ මසුන් ඇල්ලීම සඳහා 2012 වර්ෂයේ දී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හෝ වෙනත් ආයතනයක් විසින් විදේශීය රටවල් වෙත බලපත්‍ර හෝ අවසරපත්‍ර ලබාදීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම බලපත්‍ර හෝ අවසරපත්‍ර ලබාදුන් රටවල් කවරේද;

(iii) ඒවා ලබාදුන් ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි පරිදි අවසර ලබාදීමක් සිදුකර නොමැති නම්, අනවසරයෙන් ධීවර කටයුතුවල යෙදුනු බවට පැමිණිලි ලැබී තිබේද;

(ii) එම පැමිණිලිවලට අනුව අත්අඩංගුවට ගෙන ඇති යාත්‍රා සහ ඒවා අයිති රටවල් කවරේද;

(iii) අත්අඩංගුවට පත් ධීවර යාත්‍රා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) අත්අඩංගුවට නොගත් අනවසර ධීවර යාත්‍රා අයත් රටවල් කවරේද;

(v) ඒවා අත්අඩංගුවට නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3075/'12

15.
ගරු අජිත් පී. පෙරේරා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම පාඨමාලාව සඳහා මේ දක්වා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට එම පාඨමාලාව හදාරා උපාධි ලබාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය වර්ෂ 3 ක් දක්වා අඩුකිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
## (2013 ජූලි මස 26 වැනි සිකුරාදා)

3193/'12

1\.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට කොළඹ 9, දෙමටගොඩ, බේස්ලයින් පාරේ, අංක 575/17 දරන ස්ථානයේ තාවකාලිකව පදිංචි එම්. රාමසාමි මහතාට අනවසර පදිංචිකරුවන් සඳහා නිවාස ලබාදීමේ වැඩ සටහන යටතේ පැලියගොඩ අඩු ආදායම් නිවාස සංකීර්ණයෙන් කුලී පදනම යටතේ නිවසක් ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරිය එකඟතාවයක් පළ කර ඇති බවත්;

(ii) රාමසාමි මහතාට පදිංචිය සඳහා නිවසක් ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 10.05.187 හා 2005.09.26 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අංක HRC/165/03/7 (VI) යටතේ ද එකඟතාවය පළ කරනු ලැබුවත් එය මේ දක්වා ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රාමසාමි මහතාට නාගරික සංවර්ධන අධිකාරිය හරහා ස්ථිර පදිංචිය සඳහා නිවසක් ලබාදීමට නොපමාව පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3281/'12

2\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1986 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් තෝරාගත් පවුල් 31ක් මහවැලි "බී" කලාපයේ, වැලිකන්ද කොට්ඨාසයට අයත්, සේනපුර ගම්මානයේ පදිංචි කරන ලද බවත්;

(ii) 1992.04.14 දින කොටි ත්‍රස්තවාදීන් විසින් අලිංජිපොතාන ගම්වැසියන් ඝාතනය කිරීම සමග ඇතිවූ මරණ තර්ජන හමුවේ සේනපුර ගම්මානයේ පදිංචිකරුවන් ගොඩ සහ වාරි ඉඩම්වලින් ඉවත්ව ගිය බවත්;

(iii) යුද්ධය අවසන්වී ඇතිවී තිබෙන සාමකාමී පරිසරය යටතේ ඔවුන් නැවත එම ඉඩම්වල පදිංචියට යෑමට කැමැත්ත දැක්වුවත්, ඒ සඳහා මේ දක්වා එම පිරිසට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් අවසරය ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අවතැන් වූ පිරිසක් ලෙස දැනට ජීවත්වන සේනපුර වැසියන්ට නැවත එහි පදිංචිවීමට සහ ගොවිතැන් කිරීමට අවසර ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3289/'12

3.

ගරු අජිත් කුමාර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කය තුළ වසා දමන ලද හෝ ඉදිකිරීම් කටයුතුවලදී භාවිතා කරන ලද පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගයන්හි විස්තරාත්මක තොරතුරු පළාත් පාලන ආයතන මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මාර්ගවලට වූ හානිය වෙනුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් හෝ රජයේ වෙනත් ආයතනයක් මගින් අදාළ පළාත් පාලන ආයතනවලට මුදල් ප්‍රතිපාදන ලබා දුන්නේද;

(iii) එසේ නම්, ඉහත පරිදි ලබා දුන් මුදල් භාවිතා කොට එම පළාත් පාලන ආයතන විසින් අදාළ මාර්ග සකස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(ii) හි පරිදි ප්‍රතිපාදන ලබා දුන්නේ නම්,

(i) මුදල් ලබා දුන් ආයතනය;

(ii) මුදල් ලබාදුන් අදාළ මාර්ග;

(iii) එක් එක් මාර්ගය වෙනුවෙන් ලබාදුන් මුදල හා අදාළ දිනය;

කවරේද යන්න එක් එක් පළාත් පාලන ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3194/'12

4.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 9, දෙමටගොඩ, ජලාශය පටුමගේ අංක 87/4 දරන ස්ථානයේ පිහිටි කොළඹ මහ නගර සභාවට අයත් නිල නිවස, කොළඹ මහ නගර සභාවේ ජලාශ භාරකාරධූරය දැරූ ඒ. එස්. පී. සෙනෙවිරත්න නැමැත්තාට පදිංචිය සඳහා ලබාදී තිබූ බවත්;

(ii) එම පුද්ගලයා 2007 වර්ෂයේදී මිය ගොස් ඇති බවත්;

(iii) ඔහුගේ බිරිඳ හෝ දරුවන් නොමැති තත්ත්වය වසං කොට මේ වන විට එම නිල නිවසේ සෙනවිරත්න යන නමින් හැඳින්වන්නෙකු හා පවුලක් බලහත්කාරයෙන් පදිංචි වී සිටින බවත්;

(iv) මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වනු ලැබූ නඩු විභාගයකින් අනතුරුව (නඩු අංක 13724/එම්) ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා තීන්දුවක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ස්ථානයේ මේ වන විට සිටින අනවසර පදිංචිකරුවන් නොපමාව ඉවත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3282/'12

5\.
ගරු මොහමඩ් අස්ලම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇතුගල, නවසේනපුර, වැලිකන්ද, අංක 61 දරන ස්ථානයේ දැනට පදිංචි ඒ. කාදර් මීරා ඇතුළු පිරිස විසින් වගා කර 1992 වර්ෂයේදී සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් පසුව අත්හැර දැමූ මහවැලි "බී" කලාපයේ සෙවනපිටිය, කරපොල වැව ප්‍රදේශයේ රක්ෂිත ඉඩම් සහ පාරම්පරික ඉඩම්වලින් සමන්විත අක්කර 22 රූඩ් 01 පර්චස් 31ක වගා භූමිය නැවත ලබා දෙන ලෙස ඉල්ලා ඇති බවත්;

(ii) එම ඉඩම් ආපසු ලබාදීමට අදාළ යෝජනා තුනක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක එල්/බී/3/2 හා 2010.12.28 දිනැති ලිපිය මගින් මහවැලි අධිකාරියේ "බී" කලාපීය නේවාසික කළමණාකරු වෙත දැනුම් දී ඇති බවත්;

(iii) මෙතෙක් එම යෝජනා ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ලිපියේ අංක 1 යටතේ සඳහන් යෝජනාව අනුව ඒ. කාදර් මීරා ඇතුළු පිරිසට විසඳුමක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3195/'12

6\.
ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, මිලිද්දුව, එච්. කේ. එඩ්මන්ඩ් මාවතේ, අංක 160 දරන ස්ථානයේ පදිංචි එම්. ඉසඩ්. මොහමඩ් මහතා සහ ෆාතිමා සනීරා මහත්මියට අයත් පෞද්ගලික ඉඩමක් ව්‍යාජ ඔප්පුවක් මගින් අන්සතු කර ගැනීම පිළිබඳව ගාල්ල විශේෂ අපරාධ විමර්ශන අංශය මගින්, ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 21972 යටතේ පවරන ලද නඩුව පොලිසිය විසින්ම ඉල්ලා අස්කර ගෙන තිබෙන බවත්;

(ii) අංක 1977 හා 2002.11.23 දිනැති එම ව්‍යාජ ඔප්පුවේ අත්සන් හෝ මාපට ඇඟිලි සලකුණේ විකෘතිභාවයක් පවතින බවට ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් විසින් අංක ලී.ලේ. 07/2009 හා 2010.02.08 දිනැති නිල ලේඛනය මගින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම්දීම හේතුවෙන් එකී නඩුව ඉල්ලා අස්කර ගනු ලැබූ බවත්;

(iii) එම ව්‍යාජ ඔප්පුව සකස්කරන ලද නොතාරිස්වරයාට හෝ එකී නඩුවේ චූදිතයින්ට එරෙහිව මෙතෙක් නීතිමය පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ව්‍යාජ ඔප්පුව සකස් කරන ලද නොතාරිස් ඇතුළු අදාළ සැකකරුවන්ට එරෙහිව නොපමාව නීතිමය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2448/'12

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන නිල්වලා යෝජනා ක්‍රමය යටතේ ගංවතුර පාලනය කිරීම සඳහා පිහිටුවා ඇති පොම්පාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පොම්පාගාරය පිහිටා ඇති ස්ථානය කවරේද;

(iii) එම පොම්පාරගාරවලින් දැනට අක්‍රියව පවතින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගංවතුර පාලනය කිරීම සඳහා පිහිටුවා ඇති පොම්පාගාර අක්‍රියව පැවතීම නිසා නිල්වලා යෝජනා ක්‍රමය තුළින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පොම්පාගාර කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2594/'12

2\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මැතිවරණ අපේක්ෂක ලැයිස්තුවල වර්තමාන තරුණ අපේක්ෂක ප්‍රතිශතය තරුණ අසහනය පිළිබඳ කොමිසමේ නිර්දේශයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්තමාන නීතියට අනුව පළාත් පාලන මැතිවරණ අපේක්ෂක ලැයිස්තුවලට ඇතුළත් විය යුතු තරුණ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) තරුණ අපේක්ෂකයෙකු ලෙස හඳුන්වන අයෙකු අයත් වන වයස් සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉදිරි පළාත් පාලන මැතිවරණවලදී ඉහත සඳහන් තරුණ අපේක්ෂක ප්‍රතිශතය අඩු කිරීමට හෝ එලෙසම පවත්වාගෙන යෑමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද ?

2716/'12

3\.

ගරු රවි කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් 2012 වර්ෂයේදී ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකරන ලද ආයතන කවරේද;

(iii) මෙසේ වියදම් කරන ලද මුදල් ලබාගත් මූලාශ්‍ර කවරේද;

(iv) අයිතිකරුවා විසින්, ඔහු හෝ ඇය ලද නිවස සඳහා ගෙවිය යුතු මුදල කොපමණද?

(v) නිවාස වෙන්කොට ඇති අයගේ නම් ලැයිස්තුව කවරේද;

(vi) ඉහත දක්වා ඇති නිවසකට ගෙවනු ලබන ඉදිකිරීම් වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2793/'12

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දියවැඩියා රෝගීන්ගේ රුධිර සීනි පරීක්ෂණ උපකරණවලට සවිකරන Blood glucose test strip (EZ smart) SR581218 උපාංගය රජයේ රෝහල්වලට සැපයූ ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනය විසින් සැපයීම ආරම්භකර කෙතරම් කාලයක් ගතවී තිබේද;

(iii) එම උපාංගය භාවිතා නොකරන ලෙස චක්‍රලේඛයක් මගින් දන්වා තිබේද;

(iv) රෝහල්වල ඒවා භාවිතා නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

(v) එම උපාංගය ඒකකයක් සඳහා අයකළ මිල කොපමණද;

(vi) භාවිතය අත්හිටුවන අවස්ථාව වන විට වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩාවල තිබූ ඒවායේ තොග ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

(vii) මේ වනවිට භාවිතය අත්හිටුවා ඇත්නම්, ඒවා සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආයතනය ඉවත්කිරීමෙන් පසුව අදාළ උපාංගය සපයනු ලබන වත්මන් ආයතනය හඳුන්වන නම කවරේද;

(ii) එය පිළිගත් ටෙන්ඩර් පටිපාටියකට අනුව තෝරාගෙන තිබේද;

(iii) එම Test strip එකක් ලබාදෙන මිල කොපමණද;

(iv) එම ආයතනයේ හිමිකරුගේ සහ එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3044/'12

5.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ මතුගම, අගලවත්ත සහ බුලත්සිංහල යන ප්‍රදේශවල පෞද්ගලීකරණය කළ රාජ්‍ය අංශයේ වතුවල කම්කරු ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කළ මුදල් එම වතු සමාගම් විසින් කපාහැර ඇති බැවින් එම කම්කරු ජනතාව දැඩි සෞඛ්‍යමය ගැටලුවලට මුහුණ පා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රදේශවල ජීවත් වන වතු කම්කරු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතු කම්කරු ජනතාවට ලබා දී ඇති සෞඛ්‍ය පහසුකම් කවරේද;

(iii) එම වතු කම්කරු ප්‍රජාව තුළ මේ වන විට පවතින ළමා හා මාතෘ මරණ, බෝනොවන රෝග වැළඳීම්, අනිසි ගැබ් ගැනීම් සහ මන්දපෝෂණයට අදාළ සංඛ්‍යාත්මක දත්ත කවරේද;

(iv) එම ප්‍රදේශවලට අවශ්‍ය සනීපාරක්ෂක හා සෞඛ්‍ය පහසුකම් කඩිනමින් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3253/’12

6\.

ගරු පී. හැරිසන් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 නොවැම්බර් මස 09 වැනි දින වැලිකඩ බන්ධනාගාරයේ ඇතිවූ ගැටුමට මුල් වූ හේතුව කුමක්ද;

(ii) එදින බන්ධනාගාරය පරීක්ෂා කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය යෙදුවේ බන්ධනාගාර නිලධාරීන්ගේ සෝදිසි කිරීම් ප්‍රමාණවත් නොවූ නිසාද;

(iii) ඒ සඳහා එම බලකාය යෙදවීමට නියෝග ලබා දුන් අය කවුරුන්ද;

(iv) බන්ධනාගාර පරීක්ෂාවට සහභාගීවූ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් බන්ධනාගාරය තුළට ආයුධ සන්නද්ධව ඇතුල් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ගැටුමේදී,

(i) රැඳවියන්හට අවි ගබඩාවට ඇතුල්වී අවි ලබා ගැනීමට බන්ධනාගාර නිලධාරීන්ගෙන් සහය ලැබුණු බවත්;

(ii) සුරාබදු දෙපාර්තමේන්තුවේ මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරියෙකුගේ පෞද්ගලික අවශ්‍යතාව මත රැඳවියන්ට වෙඩි තැබීම සිදුවී ඇති බවත්;

(iii) බන්ධනාගාර රැඳවියන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) බන්ධනාගාර අවි ගබඩාවෙන් අවි ලබා ගැනීමට රැඳවියන්ට සහයෝගය ලබාදී ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) මියගිය රැඳවියන් වෙනුවෙන් රජය වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරන්නේද;

(iii) මෙවැනි සිද්ධීන් නැවත ඇති නොවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3408/’13

7\.

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර යාත්‍රා හෝ ධීවර යාත්‍රා නිෂ්පාදනය කරන ද්‍රව්‍ය, ධීවර යාත්‍රා එන්ජින්, දැල් වර්ග හා දැල් ආම්පන්න නිපදවීමේ ද්‍රව්‍ය සහ වෙනත් ධීවර ආම්පන්න ආනයනයේදී අයකරනු ලබන බදු වර්ග කවරේද;

(ii) ඉහත එක් එක් අයිතමය වෙනුවෙන් අයකරනු ලබන බදු වර්ගවල ප්‍රතිශතයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3467/'13

8.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ත්‍රිපෝෂ නිපදවන කර්මාන්තශාලාව පසුගිය දිනවල වසා දමා තිබුණේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කර්මාන්තශාලාව වසා දමා තිබීම, එහි ධාරිතාව 100% කින් වැඩි කිරීමට 2011 ජනවාරි මස ලංකා දුම්කොළ සමාගම වෙතින් එම කර්මාන්තශාලාව පවරා ගන්නා අවස්ථාවේදී ඇති කරගත් ඉලක්කය සපුරා ගැනීමේදී බාධාවක් නොවන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ත්‍රිපෝෂ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අත්හිටුවා ඇති තත්ත්වය යටතේ මන්දපෝෂිත දරුවන් හා ගැබිණි මව්වරුන්ට අවශ්‍ය ත්‍රිපෝෂ ලබා දීමේ වැඩසටහන නොකඩවා පවත්වාගෙන යාමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3600/'13

9.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මගින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට සුබසාධන නිලධාරීන් අනුයුක්ත කර ඇති බවත්;

(ii) විදේශ රටවලදී විවිධ හිරිහැරයට හා අතවරවලට ලක්වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට මෙම නිලධාරීන් වැඩිදෙනෙකුගෙන් නිසි සේවයක් නොලැබෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සුබසාධන නිලධාරීන් පත්කිරීමේදී සලකා බැලූ සුදුසුකම් කවරේද;

(ii) පත්කර ඇති එම නිලධාරීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඉහත තනතුර සඳහා ජාත්‍යන්තර නීති රීති පිළිබඳවත්, අදාළ රටේ භාෂාව හා සංස්කෘතිය පිළිබඳවත් දැනුමක් ඇති, සුදුසුකම් සහිත නිලධාරීන් පිරිසක් පත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3576/'13

10.

ගරු සුජීව සේනසිංහ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් සේවාව ජාල ගතකිරීම සඳහා රුපියල් කෝටි 30කට අධික මුදලක් වැය කර ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියට ලබාගත් පරිගණක හා උපාංග වර්ෂ 05ක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන නොමැති බවත්;

(iii) මිලදී ගත් පරිගණකවල වගකීම් කාලය මේ වන විට ඉක්මවා ගොස් ඇති බවත්;

(iv) එම ව්‍යාපෘතිය පවරා ඇති පුද්ගලයා දූෂණ චෝදනාවකට වරදකරු වී ඇති බවත්;

(v) ඉහත ගනුදෙනුව සම්බන්ධයෙන් තමාට දැනුමක් නැති බව සඳහන් කරමින් තැපැල්පතිවරයා වගකීමෙන් මගහැර සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපෘතිය වෙනුවෙන් මුලින් ලබාගත් රුපියල් කෝටි 30ට අමතරව තවත් රුපියල් කෝටි 35ක් තැපැල් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම් කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3729/'13

11.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "මහින්ද රාජපක්ෂ" නාමය යොදා ඇති ශ්‍රී ලංකාවේ වරායන්, රංගශාලා, ක්‍රීඩාංගණ, පාසල්, රෝහල් ආදී ස්ථාන කවරේද;

(ii) එකී නමින් එම එක් එක් ස්ථානයන් හෝ ව්‍යාපෘතීන් ආරම්භ කල දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් ආයතනයට හෝ ව්‍යාපෘතියට වැය කරන ලද සමස්ත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාසල් හා රෝහල් හැර ඉහත සඳහන් ආදායම් ලැබෙන ආයතනවලින් මෙතෙක් රටට ලැබී ඇති ආදායම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3774/'13

12.

ගරු විජිත බේරුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1987 දී ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය අතර ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමන් හා ගරු රජීව් ගාන්ධි අග්‍රාමාත්‍යතුමන් විසින් අත්සන් තබන ලද ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් අත්සන් කරන ලද දිනය හා ගිවිසුම්වල අන්තර්ගත වූ කාරණා සංක්ෂිප්තව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3868/'13

13.

ගරු කනක හේරත් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කප්රුක ආයෝජන ණය වැඩසටහන යටතේ ක්‍රියාවට නංවනු ලබන ව්‍යාපෘතියේ ස්වභාවය කවරේද;

(ii) පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා කප්රුක ආයෝජන වැඩසටහනෙන් සිදුවන දායකත්වය කවරේද;

(iii) කප්රුක ආයෝජනය යටතේ ණය ලබාදීමක් සිදුවන්නේ නම්, එම ණය පියවා ගන්නා ආකාරය කවරේද;

(iv) කප්රුක ආයෝජන වැඩසටහන යටතේ මේ වන විට ලබාදී ඇති ණය මුදල කොපමණද;

(v) මේ වන විට එම වැඩසටහන ක්‍රියාත්මක කරන දිස්ත්‍රික්ක කවරේද;

(vi) කප්රුක ආයෝජන ණය වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාවට නැංවීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3869/'13

14.

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම ග්‍රාම නිලධාරී වසමක් තුළම කප්රුක සමිති අරඹන බවට 2012 අයවැය විවාදයේදී සඳහන් කළ පරිදි, කප්රුක පුරවර වැඩසටහන යටතේ මේ වන විට පිහිටුවා ඇති එම සමිති සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් සමිතියකට චක්‍රීය අරමුදලක් ලෙස රු. 15,000/-ක් ලබා දෙන බවට කළ සඳහන අනුව මේ වන විට කප්රුක සමිතිවලට ලබාදී ඇති මුළු මුදල කොපමණද;

(iii) මේ වන විට සියලුම කප්රුක සමිතිවලට අරමුදල් ලබාදී නොමැති නම්, එම අරමුදල් ලබා දී නොමැති සමිති කවරේද;

(iv) එම සමිතිවලට අරමුදල් ලබා නොදීමට හේතුව කවරේද;

(v) මෙතෙක් අරමුදල් ලබා නොදුන් කප්රුක සමිති සඳහා අරමුදල් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2601/'12

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 71 වන පිටුවේ සඳහන් ජනතා කේන්ද්‍රීය බලය බෙදා හැරීමක් සිදු කළ යුතු බවට වන නිර්දේශය සමඟ රජය එකඟ වන්නේද;

(ii) එසේ නම්, ඒ අනුව බලය බෙදා හැරීම සඳහා පියවර ගනු ලබන්නේද;

(iii) එම පියවර කවරේද;

(iv) ඉහත නිර්දේශය පරිදි බලය බෙදා හැරීම ක්‍රියාත්මක කරන දිනය කවරේද;

(v) බලය බෙදීම මත පදනම්වූ දේශපාලනමය විසඳුමක් ලබා දෙන්නේ නම්, ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 අගෝස්තු මස 07 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2595/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන මැතිවරණ නීතිවලට අනුකූලව එම මැතිවරණ සඳහා ඉදිරිපත් කරන අපේක්ෂක ලැයිස්තුවල කාන්තාවන් සඳහා අවම අපේක්ෂකත්ව ප්‍රතිශතයක් තිබේද;

(ii) නොඑසේ නම්, කාන්තා අපේක්ෂකයින් වෙනුවෙන් එම අපේක්ෂක ලැයිස්තුවල නිශ්චිත ප්‍රතිශතයක් වෙන්විය යුතු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම වෙන් විය යුතු ප්‍රතිශතය කොපමණද;

(iv) වර්තමාන කාන්තා ජනගහන ප්‍රතිශතයට සාපේක්ෂව කාන්තාවන් සඳහා වෙන්වන ඉහත සඳහන් අපේක්ෂකත්ව ප්‍රතිශතය ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/'12

2.

ගරු මනූෂ නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2012 වර්ෂයේ දී ගාල්ල අධ්‍යාපන කලාපයේ පිහිටි ජාතික පාසල්වල;

(i) පළමුවැනි ශ්‍රේණියේ සිට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා පන්තිවල ඉගෙනුම ලැබූ සිසුන් සංඛ්‍යාව එක් එක් පන්තිය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමුවැනි ශ්‍රේණියට සම්මුඛ පරීක්ෂණයෙන් සමත් සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කොට තිබේද;

(iii) පළමුවැනි ශ්‍රේණියට එසේ ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

(iv) පළමුවැනි ශ්‍රේණියට හැර අනෙකුත් ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර තිබේද;

(v) අනෙකුත් ශ්‍රේණි සඳහා ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණයන්ගෙන් සමත් වන සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කිරීම සඳහා බලය පැවරූ නීත්‍යානුකූල ලිපි ලේඛන තිබේද;

(ii) එකී ලිපි ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2903/'12

3.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුවන්විදුලි මධ්‍යස්ථාන සඳහා සංඛ්‍යාත වෙන් කර දෙනු ලබන්නේ විදුලි සංදේශ නියාමන කොමිසම මගින්ද;

(ii) 2006 වර්ෂයේ සිට මේ දක්වා එලෙස ගුවන් විදුලි මධ්‍යස්ථානවලට සංඛ්‍යාත වෙන්කර දීමෙන් රජය උපයාගත් ආදායම එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කලින් ලබාදී තිබූ සංඛ්‍යාතයන්හි යම් වෙනස්කිරීම් කරන ලද්දේද හා එම සංඛ්‍යාතයම නව සමාගම්වලට නැවත වෙන්කරදීම් කිසිවක් සිදු කරන ලද්දේද;

(iv) එසේ නම්, ඉහත (iii) හි සඳහන් වූ පරිදි සංඛ්‍යාත ලැබුණු සමාගම්වල නම් සහ එම සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(v) මෙලෙස ගුවන්විදුලි සංඛ්‍යාත නැවත වෙන්කර දීම තුළින් රජය ලත් ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2925/'12

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පින්නවල අලි අනාථාගාරය ආසන්නයේ සත්වෝද්‍යානයක් ඉදිකිරීම ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදලින් මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(iii) එහි ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් කර තිබේද;

(iv) නොඑසේ නම්, ඉදිකිරීමට ඇති ඉතිරි කොටස් කවරේද;

(v) එම කොටස්වල ඉදිකිරීම් අවසන් කිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නව සත්වෝද්‍යානය විවෘත කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(ii) එම සත්වෝද්‍යානය ආරම්භ කිරීමත් සමඟ දෙහිවල සත්වෝද්‍යානය වසා දැමීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3023/'12

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් මුහුදෙන් ගෑස් නිධියක් හමු වී තිබේද;

(ii) එසේ නම්, එම ගෑස් නිධිය සොයා ගත් දිනය කවරේද;

(iii) මේ වන විට එම ගෑස් නිධියේ කැණීම් කටයුතු ආරම්භකර තිබේද;

(iv) එසේ නම්, මේ වනවිට ලබා ඇති ප්‍රගතිය කවරේද;

(v) එම ගෑස් නිධියෙන් ඉන්ධන ලබා ගැනීමට හැකියාව ලැබෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මන්නාරම මුහුදේ හමුවූ ගෑස් නිධිය වෙන්දේසි කිරීමට කටයුතු යොදන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළ වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3053/'12

6.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහවැලිගම කනිෂ්ඨ විද්‍යාලයේ මේ වන විට ඉගෙනුම ලබන සිසුන් 249 ට ඉගැන්වීම සඳහා සිටින්නේ ගුරුවරුන් තිදෙනෙක් පමණක් බවත්;

(ii) එම විද්‍යාලය තුළ තවත් අඩුපාඩු රැසක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විද්‍යාලයේ පවත්නා ගුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙතෙක් පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් අයදුම්පත්‍ර කැඳවීමක් කොට අදාළ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එම විද්‍යාලයේ පවතින අඩුපාඩු නිසා සිසුන්ට මුහුණදීමට සිදුවී ඇති දැඩි දුෂ්කරතා පිළිබඳව සොයා බලා එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3285/'12

7.

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පෞද්ගලික සමාගමක වියදමින් සිදුකළ මැදවච්චිය, ඇතාකඩ, ඇටඹගස්කඩ මාර්ගයේ කාපට් අතුරා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු විසින් රුපියල් ලක්ෂ එකසිය හැටක මුදලක් වංචනික ලෙස ලබා ගෙන ඇති බවත්;

(ii) පළාතේ මාර්ගයන් පිළිබඳව මැනවින් කරුණු දැනසිටි උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු උසස්ම නිලධාරියෙකු ඉහත ගෙවීම් වංචනික ලෙස නිර්දේශ කර ඇති බවත්;

(iii) අනුරාධපුර, ඔයාමඩුවේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර - ඔයාමඩුව මාර්ගයේ කිලෝමීටර් 3ක අලුත්වැඩියාව සඳහාද රුපියල් කෝටි නවයකට ආසන්න මුදලක් ගෙවා ඇති බවත්;

(iv) උතුරු මැද පළාතේ මාර්ග අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී ටෙන්ඩර් පරිපාටිය මුළුමනින්ම උල්ලංඝනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ මාර්ග සංවර්ධන අධිකාරිය ඉහත අයුරින් කොපමණ මාර්ග සංඛ්‍යාවක් මූල්‍ය වංචා සහිතව අලුත්වැඩියා කර තිබේද යන්න සොයා බලන්නේද;

(ii) එකී වංචා සිදුකළ නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3577/'13

8.

ගරු සුජීව සේනසිංහ මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් ගුවන් සේවය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අරාබි එමිරේට් රජයේ ඔසරෙන් බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 175ක ණයක් ඉල්ලා තිබේද;

(ii) ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) ලබා ගන්නා රුපියල් බිලියන 21 න් රුපියල් බිලියන 15 ක ණය මුදලක් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට පියවීමට තිබේද;

(iv) ගුවන් තොටුපල සඳහා අවශ්‍ය ණය මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අභ්‍යන්තර ගුවන් තොටුපලක් ඉදිකිරීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් රැසක් තිබියදී ඒ සඳහා නුවරඑළිය බොරලන්ද ප්‍රදේශයේ පිදුරුතලාගල වතුයාය තෝරාගැනීමට හේතුව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3730/'13

9.

ගරු අනුර දිසානායක මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ ඇති පොල් වතු වෙනත් පුද්ගලයින් වෙත විකුණා තිබේද;

(ii) එසේ නම්, එම වතු මිලදී ගත් පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් වාරියපොල රන්දෙනියවත්තේ හා පන්නල නාඹිරිත්තන්කඩවල ගාර්ඩ්ලන්ඩ්වත්තේ සේවකයන් කුරුණෑගල ගනේවත්තේ පිහිටි ඇන්ජලෝවත්තෙහි (මැල්වත්ත) සේවයේ යෙදවීමේ පදනම හා ඊට අදාළ සම්බන්ධතාව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2012 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට පොල් ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) මේ වන විට සියලුම ආකාරයේ පොල් වගාකරුවන් වෙත ලබාදී ඇති සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3776/'13

10.

ගරු විජිත බේරුගොඩ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බ්‍රිතාන්‍ය පාලනය යටතේ හා නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පරිපාලන පළාත් බෙදීම් ප්‍රකාශයට පත් කළ වර්ෂයන් කවරේද;

(ii) එම එක් එක් අවස්ථාවේදී ශ්‍රී ලංකාව තුළ ඇති කරන ලද පළාත් කවරේද;

(iii) එම පළාත් බෙදීම් සංශෝධනය වූ අවස්ථාවන් කවරේද;

(iv) ඒ අනුව ඇති කරන ලද පළාත් නම් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3872/'13

11.

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ,

(i) අලුතින් ඉදි කරන ලද, ඉදිකෙරෙමින් පවතින, ඉදිකිරීමට යෝජිත හා වැඩි දියුණු කරන ලද ධීවර වරායන් සංඛ්‍යාව;

(ii) අලුතින් ඉදිකරන ලද නැංගුරම් පොළවල්, කරදිය හා මිරිදිය ධීවර තොටුපළවල්, අයිස් යන්ත්‍රාගාර, ශීතාගාර, යාත්‍රාංගණ හා දැල් කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iii) ධීවර කටයුතු සඳහා අලුතින් යොදවන ලද ධීවර යාත්‍රා සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන සැළසුම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2904/'12

12.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ජංගම සහ CDMA දුරකථන සබඳතා සැපයීම සඳහා බලපත්‍ර ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2006 වර්ෂයෙන් පසුව ජංගම සහ CDMA දුරකථන පහසුකම් සපයන සමාගම්වලට නිකුත් කරන ලද නව සංඛ්‍යාතයන් සහ දුරකථන මාර්ග කවරේද;

(iv) එම සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(v) සංඛ්‍යාතයන් සහ දුරකථන මාර්ග වෙන් කිරීමේදී ලබාගත් විශේෂඥ උපදෙස් කවරේද;

(vi) 2011 සහ 2012 වර්ෂ සඳහා ඉහත සමාගම් මගින් රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන් සමාගම් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වෙළඳපල මිලට වඩා සැලකිය යුතු තරම් අඩු මුදලකට ජංගම දුරකථන පහසුකම් සපයන සමාගම්වලට බලපත්‍ර ලබා දී තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2926/'12

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාල සීමාව තුළ ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට ලබාදී ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් වැයකර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති කළමනාකරණය කළ අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘති සඳහා මුදල් වැයකිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් විගණනයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එමගින් හෙළිවූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3140/'12

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 509/7 හා 1988.06.07 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව යටතේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවාගනු ලබන නිලධාරීන් පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට අවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, එකී සේවා ව්‍යවස්ථාවේ ඒ බව සඳහන් වගන්තිය කවරේද;

(iii) එවැනි වගන්තියක් නොවේ නම්, ඉහත කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු බවට සඳහන් කොන්දේසිය පත්වීම් ලිපිවල ඇතුළත් කිරීම සඳහා එකී සේවා ව්‍යවස්ථාවේ 28 වන වගන්තිය යටතේ ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iv) සේවා ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් නොවන්නේ නම් හා 28 වන වගන්තිය අනුව ක්‍රියාමාර්ග නොගත්තේ නම් ඉහත පරිදි බඳවාගත් නිලධාරීන්ගේ පත්වීම් ලිපිවලට (අ) iii හි සඳහන් කොන්දේසිය ඇතුළත් කළ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි අදාළ පත්වීම් ලිපිවල එම සේවා ව්‍යවස්ථාවට අනනුකූල පරිදි කොන්දේසි ඇතුළත් කිරීම නිසා අසීරුවට පත්ව ඇති නිලධාරීන්ට සහනයක් සලසන්නේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3347/'12

15.

ගරු පී. හැරිසන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඇති කුලී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2013 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2596/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005- 2011 අතර කාලය තුළ විදේශ රැකියා නියුක්ති කාර්යංශයේ ලේඛනගතව රැකියා සඳහා විදේශගත වී ඇති කාන්තාවන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පරිදි රැකියා සඳහා විදේශගත වූ කාන්තාවන් සංඛ්‍යාව එම එක් එක් වර්ෂයේදී රැකියා සඳහා විදේශගතවූ සම්පූර්ණ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කාන්තාවන් කුමන වෘත්තීන් සඳහා විදේශගතවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා සඳහා නික්ම යන කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මකවන වැඩ පිළිවෙළ කවරේද;

(ii) ඉදිරියේදී එම වැඩ පිළිවෙළ වඩාත් විධිමත්ව හා ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එය සිදුකරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2927/'12

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වත්මන් ලේකම්වරයාගේ නම, ලිපිනය, උපන් දිනය සහ ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම පුද්ගලයා මින් පෙර දරන ලද තනතුරු සහ අදාළ ආයතන කවරේද;

(iii) එම නිලධාරියා මින් පෙර තනතුරු දරන ලද ආයතනවලදී මූල්‍ය අක්‍රමිකතාවන්ට චෝදනා ලබා තිබේද;

(iv) එසේ චෝදනා ලබා තිබේ නම්, එවැනි පුද්ගලයෙකු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා පත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2938/'12

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයින් ගණනාවක් විසැහවිල්ලේ සිටින බව වාර්තාවීමට හේතු කවරේද;

(ii) එසේ විසැහවිල්ලේ සිටින ගුවන් හමුදා සාමාජිකයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන තිබේද; එසේ නැතහොත්, ඔවුන්ට සමාව ලබාදීමක් හෝ ඔවුන් විසින් ගෙවිය යුතු දඩ මුදල් අඩු කිරීමක් සිදු කර තිබේද;

(iii) එසේ සමාව ලබාදී නොමැති නම්, ඔවුන්ට විරුද්ධව නීතිමය හෝ අධිකරණමය ක්‍රියාමාර්ගවලට එළැඹ තිබේද;

(iv) එසේ නම්, එලෙස පලාගොස්, නීතිමය ලෙස අධිචෝදනා ලැබ සිටින හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයින් ක්‍රියාන්විතයේදී අතුරුදහන්වීම හෝ විසැහවිල්ලේ සිටීම හේතුවෙන් ගුවන් හමුදාවට ඉතිරිවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3024/'12

4\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු නැගෙනහිර පැවති යුද්ධය සඳහා 2004 වර්ෂයේ සිට රජය විසින් ආයුධ මිල දී ගත් රටවල් කවරේද;

(ii) මිල දී ගත් එම ආයුධවලින් මේ වනවිට ඉතිරිවී ඇති ආයුධ කවරේද;

(iii) ඒවායෙහි සමස්ත වටිනාකම කොපමණද;

(iv) එම ආයුධවල මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යුද්ධය සඳහා මිලට ගත් මේ වන විට ඉතිරිවී ඇති ආයුධ නැවත විකිණීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, විකිණීමට අපේක්‍ෂිත ආයුධ කවරේද;

(iii) එම ආයුධ විකුණනු ලබන රටවල් කවරේද;

(iv) එම ආයුධ විකුණන මිල ගණන කවරේද;

(v) එකී ආයුධ විකිණීම තුළින් අපේක්ෂිත සමස්ත ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3578/'13

5\.

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහ බැංකුවේ වත්මන් විදේශ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) වත්මන් ඒක පුද්ගල ණය ප්‍රමාණය කොපමණද;

(iii) මුළු ණය බර කොපමණද;

(iv) රාජ්‍ය ණය බර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2598/'12

6\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජයේ පාසල්වල ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ ඌනතාවයක් තිබේද;

(ii) එසේ නම්, පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉංග්‍රීසි භාෂා ගුරු හිඟය මඟ හැරවීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උසස් මට්ටමේ ඉංග්‍රීසි භාෂා ගුරු පුහුණුවක් ලබාදීමට මේ වන විට ක්‍රියාවට නංවා ඇති විධිවිධාන කවරේද;

(ii) එම විධිවිධානයන් ඉහත සඳහන් ආකාරයේ ඉංග්‍රීසි භාෂා පුහුණුවක් ලබාදීමට ප්‍රමාණවත් වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද ?

2928/'12

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උක් පර්යේෂණ ආයතනයේ කොළඹ කාර්යාලය පවත්වාගෙන යාමේ අරමුණු කවරේද;

(ii) එම කාර්යාල ගොඩනැගිල්ල සඳහා මාසිකව ගෙවනු ලබන කුලිය කොපමණද;

(iii) කොළඹ පිහිටි එම කාර්යාලයේ සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ වැටුප් හා දීමනා, දුරකථන බිල්, විදුලි බිල් ආදිය ගෙවීම සඳහා මාසිකව වැය වන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක් පර්යේෂණ ආයතනය විසින් පසුගිය වර්ෂ පහ තුළදී උපයා ගන්නා ලද සෙස් බදු ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සෙස් බදු එකතු කිරීම සඳහා මහ භාණ්ඩාගාරයේ අනුමතිය ලැබී තිබේද;

(iii) ඉහත සඳහන් සෙස් බදු ආදායමෙන් පර්යේෂණ කටයුතු සඳහා වාර්ෂිකව වියදම් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2939/'12

8.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයින් ගණනාවක් විසැඟවිල්ලේ සිටින බව වාර්තාවීමට හේතු කවරේද;

(ii) එසේ විසැඟවිල්ලේ සිටින නාවික හමුදා සාමාජිකයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන තිබේද, එසේ නැතහොත් ඔවුන්ට සමාව ලබාදීමක් හෝ ඔවුන් විසින් ගෙවිය යුතු දඩ මුදල් අඩු කිරීමක් සිදු කර තිබේද;

(iii) එසේ සමාව ලබාදී නොමැති නම්, ඔවුන්ට විරුද්ධව නීතිමය හෝ අධිකරණමය ක්‍රියාමාර්ගවලට එළැඹ තිබේද;

(iv) එසේ නම්, එලෙස පලාගොස්, නීතිමය ලෙස අධිචෝදනා ලැබ සිටින හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයින් ක්‍රියාන්විතයේදී අතුරුදහන්වීම හෝ විසැඟවිල්ලේ සිටීම හේතුවෙන් නාවික හමුදාවට ඉතිරිවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද යන්න ද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3025/'12

9\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.07.18 හෝ ආසන්න දිනක මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයට ගල් ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) අධිකරණයට එවැනි ප්‍රහාරයක් එල්ල කිරීමට හේතු කවරේද;

(iv) එම සිද්ධියට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සිදුවීම සිදුවූ කාල සීමාවේදී එකී අධිකරණයේ විනිසුරුතුමා වෙත තර්ජනය කළ බවට පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, එකී පැමිණිල්ලේ චූදිතයින් කවුරුන්ද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3579/'13

10\.

ගරු සුජීව සේනසිංහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විශ්‍රාම යන සේවකයන්ට 2009 සිට පාරිතෝෂික මුදල් ගෙවා නොමැති බව දන්නේද;

(ii) එම වර්ෂයේ සිට පාරිතෝෂික මුදල් ගෙවීමට ඇති ශ්‍රී ලංගම සේවක / සේවිකාවන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත නම් සඳහන් සමස්ත සේවකයන්ට ගෙවීමට ඇති පාරිතෝෂික මුදලේ මුළු වටිනාකම කොපමණද;

(iv) ඔවුන්ට පාරිතෝෂික මුදල් ගෙවීමට කටයුතු කරන ආකාරය දින වකවානු සහිතව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2012 වර්ෂයේ සිට විශ්‍රාම ගිය ශ්‍රී ලංගම සේවකයින්ගේ පාරිතෝෂික මුදල් ගෙවීම ඔවුන් විශ්‍රාම ගෙන කොපමණ කලකින් සිදුකරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2600/'12

11\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 68 වන පිටුවේ සඳහන්,

(i) 1994 අංක 26 දරන පනත මගින් හඳුන්වා දෙන ලද සංශෝධනය මගින් මහජන පෙත්සම් ක්‍රමය දියුණු කිරීමට දරන ලද උත්සාහය ප්‍රමාණවත් නොවූ බවට වන ප්‍රකාශය සමග සහ

(ii) පුරවැසි දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කිරීමට පාර්ලිමේන්තු කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන් තනතුරට අදාළ නීති ප්‍රමාණවත් නොවන බවට වන ප්‍රකාශය සමග;

රජය එකඟ වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුරවැසියන්ගේ දුක්ගැනවිලි විසඳීමට ස්වාධීන ආයතනයක් පිහිටුවීමට ඉහත කොමිෂන් සභාව කර ඇති නිර්දේශය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2929/'12

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 වර්ෂයේදී උක් පර්යේෂණ ආයතනයේ දූෂණ හා අක්‍රමිකතා සෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශ කවරේද;

(ii) එහි නිර්දේශ මේ වනවිට ක්‍රියාත්මක කර තිබේද;

(iii) ඉහත සඳහන් ත්‍රිපුද්ගල කමිටුව සඳහා දරන ලද වියදම කොපමණද;

(iv) එම ගෙවීම් සඳහා උක් පර්යේෂණ ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමතිය ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3026/'12

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටීමේ අවස්ථාව 2012 වර්ෂයට පමණක් සීමාවේද;

(ii) එසේ නම්, 2012 වර්ෂයේදී විභාගයට ඉදිරිපත්ව අසතුටුදායක ප්‍රතිඵල ලබා ගත් සිසුන්ට දෙවැනි වර ඉදිරිපත් වීමේදී නව නිර්දේශය අනුව පවත්වන විභාග සඳහා මුහුණදීමට සිදුවේද;

(iii) පැරණි නිර්දේශය අනුව අධ්‍යාපනය හැදෑරූ ඔවුන්ට නව නිර්දේශය යටතේ විභාග සඳහා ඉදිරිපත් වීමේ දී ගැටලු ඇති වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එමගින් එම සිසුන්ට බලවත් අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

(v) එය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) පැරණි නිර්දේශයට අනුව විභාගයට ඉදිරිපත්වූ සිසුන්ට නැවත ඉදිරිපත්වීමේ අවස්ථාව නොලැබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3109/'12

14.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ කටයුතු පිළිබඳ අධීක්ෂණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් හෙතෙම එම තනතුරට පත් කරන ලද කාලය තුළදී සිදුකරන ලද අධීක්ෂණ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද; සහ

(ii) තත්වාකාර විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා වන්නේ ඔහුද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අධීක්ෂණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් සිදු කරන ලද ඉහත (අ)(i) හි සඳහන් එක් එක් විදේශ සංචාරයට අදාළව,

(i) ගුවන් ගමන් වියදම කොපමණද;

(ii) හෝටල්වල නවාතැන්, අභ්‍යන්තර සංචාර සහ සංග්‍රහ සඳහා වියදම් කවරේද;

(iii) අධීක්ෂණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ වියදම් සඳහා ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල විසින් සිදු කරන ලද ගෙවීම් කවරේද;

(iv) විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3580/'13

15.

ගරු සුජීව සේනසිංහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පාලනය වන සේවා ස්ථානවල සේවකයින්ට හිමි අර්ථ සාධක අරමුදල් 2010 වර්ෂයේ සිට බැංකුගත කර නොමැති බවත්;

(ii) අර්ථ සාධක අරමුදල් බැංකු ගත නොකිරීම නිසා 2010 වර්ෂයේ සිට විශ්‍රාම යන ශ්‍රී ලංගම සේවකයින්ට අර්ථ සාධක අරමුදල් ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත ආයතනයේ සේවා ස්ථානවලට අර්ථ සාධක අරමුදල් ලෙස බැංකුගත කිරීමට ඇති මුළු මුදල කොපමණද;

(ii) මෙම අර්ථසාධක අරමුදල් බැංකුගත කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iii) මෙම මුදල් නියමිත දිනට බැංකු ගත නොකිරීම නිසා අධිභාරය වශයෙන් ගෙවිය යුතු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා
# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 15/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

3.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

4.

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

5.

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම, — මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

13.

ගරු රවි කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

14.

ගරු රවි කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

15.

ගරු රවි කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

16.

ගරු රවි කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

17.

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදිකිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

18.

ගරු රවි කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

19.

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

20.

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන්

සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

21.

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

22.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවිව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

23.

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

24.

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

25.

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

26.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

27.

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

28.

ගරු රවි කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

29.

ගරු රවි කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

30.

ගරු රවි කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

31.

ගරු රවි කරුණානායක මහතා,— මූලාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මූලාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

32.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

33.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

34.

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

35.

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ධ්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

36.

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපලට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,— අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

37.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

38.

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

39.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

40.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

41.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

42.

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතුන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

43.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

44.

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

45.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත්

කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

46.

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

47.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

48.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

49.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

50.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික

ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

51.

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

52.

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

53.

ගරු බුද්ධික පතිරණ මහතා, —නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

54.

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

55.

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

56.

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන්

වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

57.

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

58.

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

59.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

60.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

61.

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

62.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

63.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මහ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

64.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

65.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

66.

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

67.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

68.

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

69.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

70.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

71.

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

72.

ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

73.

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

74.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

75.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ

කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

76.

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

77.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

78.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

79.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන් තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

80.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

81.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්ත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු

වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

82.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

83.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාකය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

84.

ගරු රවී කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

85.

ගරු රවී කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

86.

ගරු රවී කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

87.

ගරු රවී කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/’11

88.

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/’12

89.

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/’10

90.

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැඟුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/’12

91.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/’12

92.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'12

93.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'12

94.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'12

95.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 164/'12

96.

ගරු රවී කරුණානායක මහතා,— සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කිරීම,— දේශපාලන මැදිහත්වීම් සහ දේශපාලන අනුග්‍රහයන්ට විශේෂයෙන් සම්බන්ධ සියලුම බාධකයන් ඉවත් වන පරිදි, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 165/'12

97.

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වා දීම,— වත්මන් මැතිවරණ ක්‍රමය තුළ පවත්නා බොහෝ අඩුපාඩු මගහරවා වඩාත් සතුටුදායක තත්ත්වයකට පත්කිරීමට සහය වනු පිණිස, තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වාදීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 166/'12

98.

ගරු රවී කරුණානායක මහතා,— විවෘත ඡන්ද හිමි නාම ලේඛනයක් හඳුන්වාදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය වර්තමානයෙහි පවත්වාගෙන යන ස්ථාවර ආකාරයේ නාම ලේඛනයක් වෙනුවට විවෘත නාම ලේඛනයක් බවට

පත් කරනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.170/'12

99.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.171/'12

100.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.172/'12

101.

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

102.

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.175/'13

103.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.176/'13

104.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර්

කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.177/'13

105.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25-30 ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'13

106.

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.179/'13

107.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.180/'13

108.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.181/'13

109.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිය පුහුණු ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ අධිකරණයන්හි යුක්තිය පසිඳලීම සඳහා ප්‍රමුඛතම අවශ්‍යතාවයක් වන්නේ ගුණාත්මකභාවයෙන් ඉහළ විනිශ්චයකාර වෘත්තියක් ස්ථාපිත කිරීම බැවින්, ඒ සඳහා අත්‍යාවශ්‍ය "ගුණාත්මකභාවයෙන් ඉතා ඉහළ" පුහුණුවක් ලබා දීම සඳහා දැනට පිහිටුවා ඇති "ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය" කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින්,

විනිශ්චයකාරවරුන් පුහුණු කිරීමට විශ්වවිද්‍යාලයක ප්‍රමිතියට අනුකූලවූ විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිය පුහුණු ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.182/’13

110.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ද්විතීයික පාසල් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොමිලයේ ලබාදීම,— ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසලකම ද්විතීයික අධ්‍යාපනය සහ සියලු රජයේ විශ්ව විද්‍යාලයන්හි සම්පූර්ණ අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා දිය යුතු බවත්, එකී අධ්‍යාපනය සම්පූර්ණ රජයේ වියදමෙන් ලබාදෙන නිදහස් අධ්‍යාපනයක් විය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.183/’13

111.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මෝටර් වාහන හා සම්බන්ධ වන්දි නඩු සඳහා ලඝු කාර්ය පටිපාටියක් හඳුන්වාදීම,— මෝටර් වාහන හා සම්බන්ධ හදිසි අනතුරුවලින් මියගිය තැනැත්තන්ගේ උරුමකරුවන්ට සහ යැපෙන්නන්ට ද, එවැනි හදිසි අනතුරුවලින් තුවාල ලැබූ තැනැත්තන්ට ද වන්දි ලබාගැනීම සඳහා ඉතා අසීරු සහ දීර්ඝ අධිකරණ ක්‍රියාදාමයකට සහභාගීවීමට සිදුවීමෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වන බැවින්, මෝටර් වාහන හා සම්බන්ධ වන්දි නඩු සඳහා ලඝු කාර්ය පටිපාටියක් හඳුන්වා දෙන පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 186/’13

112.

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්තිවල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම්වලට යොමු කෙරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.188/’13

113.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව නගා සිටුවීම,— ඉහළ තලයේ කුසලතාවක්, කඩිසරභාවයක්, ශාරීරික යෝග්‍යතාවයක්, ක්ෂණික තීරණ ගැනීමක් සහ කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමක්, අවශ්‍ය කරන ප්‍රශස්ත ක්‍රීඩාවක් වන වොලිබෝල් ජාතික ක්‍රීඩාව නගා සිටුවීම සඳහා හොඳින් සැලසුම් කළ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.189/’13

114.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— බීරළු නමින් හඳුන්වනු ලබන සම්ප්‍රදායික අත්යන්ත්‍ර රේන්ද කර්මාන්තය නගා සිටුවීම,— රේන්ද නිෂ්පාදනයේ නිරත ග්‍රාමීය ජනතාවට ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකියාව සලසා දීම සඳහා ඔවුන්ට නවීන පහසුකම් දෙමින් බීරළු ගෘහස්ත කර්මාන්තය වැඩි දියුණු කිරීමට සහ රේන්ද සහ රේන්ද නිෂ්පාදන සංචාරකයන් අතර ජනප්‍රිය කරවීමට ඵලදායී සහ අර්ථවත් පියවර ගත යුතුයැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.187/’13

115.

ගරු රවී කරුණානායක මහතා,— අමාත්‍ය ආරක්ෂක අංශ නිලධාරීන් දේශපාලනඥයන්ට පමණක් සීමා කිරීම,— අමාත්‍ය ආරක්ෂක අංශය (MSD) මඟින් සපයා දෙනු ලබන ආරක්ෂක නිලධාරීන් දේශපාලනඥයන්ට පමණක් සීමා කළ යුතු බවත් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට ලබා නොදිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.190/'13

116.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික හේතූන් මත තරුණ මව්වරුන් ශ්‍රී ලංකාවෙන් පිටවී යාම වැළැක්වීමට නීති පැනවීම,— ශක්තිමත් සහ ප්‍රීතිමත් පවුල් පරිසරයක් ගොඩනැගීම සඳහා තරුණ මව්වරුන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබන හෙයින් ද, මෑත කාලයේදී එවැනි මව්වරුන් ශක්තිමත් පවුල් ඒකකයක පවතින සාරධර්ම විනාශකර දමමින් සහ බරපතල සමාජ අර්බුදයක් නිර්මාණය කරමින් විදේශ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව ගිය හෙයින් ද, අවුරුදු පහට වඩා අඩු වයසැති දරුවන් සිටින මව්වරුන් ආර්ථික හේතූන් මත ශ්‍රී ලංකාවෙන් බැහැරවීම වැළැක්වීමට සුදුසු නීති පැනවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.191/'13

117.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.192/'13

118.

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව අධ්‍යාපන ක්‍රමය ප්‍රමාණාත්මකව වර්ධනය වී ඇතත් ඊට සාපේක්ෂව අධ්‍යාපනය ගුණාත්මකව සහ ව්‍යුහාත්මකව වර්ධනය නොවීම නිසා ගුරුවරුන්ටත් සිසු දරු දැරියන් සහ දෙමාපියන්ටත් පීඩාකාරීවන වටපිටාවක් නිර්මාණය වී ඇති හෙයින් ද,

එම කරුණට අදාළව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ අකටයුතු හා අසාධාරණකම් මෙන්ම වංචා සහ දූෂණ සිදුවන බවට සමාජ මතයක් නිර්මාණය වී ඇති හෙයින් ද,

සමස්ථ අධ්‍යාපන ක්‍රමයේ සුවිශාල වෙනස්කම් සහ ප්‍රතිසංස්කරණ රැසක් සිදුවිය යුතු බවට පොදු ජන මතයක් ගොඩනැගී ඇති හෙයින් ද,

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි දක්වා ඇති දැනුම කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගය සැලකිල්ලට ගනිමින්ද,

සමස්ත ලාංකීය ශිෂ්‍ය පරම්පරාවේ අනාගතය නිර්මාණය කිරීමට අදාළ වන ලෙස ළදරු පාසල් අවධියේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා සිසුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට අදාළවන පරිදි ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම කල් දැමිය නොහැකි සහ ජාතික ප්‍රමුඛතාව ලැබිය යුතු කරුණක් හෙයින් ද,

(අ) පෙර පාසල්, ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අධ්‍යාපනයෙහි ඇති විය යුතු ප්‍රමාණාත්මක, ගුණාත්මක සහ ව්‍යුහාත්මක වෙනස්කම් වේ දැයි සොයා බැලීම පිණිසද,

(ආ) ජාතික, ආගමික සහ සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමය තුළ ඇති කළ යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඇ) පිරිවෙන් අධ්‍යාපනයේ සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඈ) පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් තිබේද යන්න සොයා බැලීම පිණිසද,

(ඉ) සියලුම විභාග සහ පරීක්ෂණ ප්‍රතිඵල ඉහළ මට්ටමකට ගෙන ඒම සහ උසස් අධ්‍යාපන සුදුසුකම් නොලබන සිසුන් වෙනුවෙන් අධ්‍යාපන ක්‍රමය තුළ ලබා දිය හැකි විකල්ප ක්‍රියා මාර්ග ඇතිකළ යුතුද යන්න සොයා බැලීම පිණිසද,

(ඊ) විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලැබුවත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයකට ඇතුළත් නොවී විදේශයන්හි අධ්‍යාපනය ලැබීම පිණිස විදේශ ගතවන සිසුන්ට මෙරට තුළදීම අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා ලබා දිය හැකි ක්‍රමවේදයන් වේදැයි සොයා බැලීම පිණිසද,

(උ) අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මකවීම තුළ ප්‍රාදේශීය, ජාතීන් සහ ආගමික වශයෙන් පවතින විෂමතා ඉවත් කිරීමට ගතයුතු ක්‍රමවේදයන් කවරේදැයි සොයා බැලීම පිණිසද,

(ඌ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී මධ්‍යම රජය සහ පළාත් සභා අතර ඇතිවිය යුතු අන්තර් සම්බන්ධතාවන්හි ස්වභාවය පිළිබඳව සොයා බැලීම පිණිසද,

(එ) අධ්‍යාපන ක්‍රියාවලියේදී, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමස්ථ අධ්‍යාපනවේදීන්ගේ වගකීම සහ කාර්යය නිශ්චය කිරීම සඳහා ගතයුතු පියවර කවරේදැයි සොයා බැලීම පිණිසද,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2.)

(අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසිඑක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඇ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක(03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ යුතුය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව

කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට බලය තිබිය යුතු ය.

පා. 37/'10

2.

ගරු රවී කරුණානායක මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— රට පුරා පවතින අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟය පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟයක් රට පුරා පවතින හෙයින් ද,

මෙම හිඟය සඳහා හේතු ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කර ඇති හෙයින් ද,

මෙම තත්වය නිවැරදි කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනමින් නොගතහොත්, මහත් ව්‍යසනයක් ඇතිවිය හැකි හෙයින් ද,

(අ) මෙම ඖෂධ හිඟය සඳහා හේතු විමසා බැලීම සඳහාත්;

(ආ) මෙම තත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය කෙටි කාලීන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

(ඇ) අනාගතයේ මෙබඳු තත්වයක් යළි ඇතිවීම වැළැක්වීමට ගතයුතු ස්ථිර ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම

පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්ය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂෙත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට ; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 38/'10

3.

ගරු රවී කරුණානායක මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු නිමල් විජේසිංහ මහතා,— කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල යළි යළිත් ජල ගැලීම් ඇති වීමට හේතු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පසුගිය දින ගණනාවක් තුළ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ වැඩි කොටසක් සහ කොළඹ දිස්ත්‍රික්කයේ විශාල කොටස් තදබල ජල ගැලීම් වලට ගොදුරු වී ඇති හෙයින් ද,

මෙය, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය තුළ වෙසෙන පුරවැසියන්ගේ ජීවිත වල නිරන්තරයෙන් යළි යළිත් ඇතිවන ලක්ෂණයක් බවට පත්ව ඇති හෙයින් ද,

මේ පිළිබඳ වගකීම ඇත්තවුන් මෙම තත්ත්වය පාලනය කිරීමට කිසිදු ප්‍රයත්නයක් දරා නොමැති හෙයින් ද,

මෙම ජල ගැලීම් යළි යළිත් ඇතිවීම වැළැක්වීම පිණිස කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබ නොමැති හෙයින් ද,

කාලයත් සමඟ තත්ත්වය වඩ වඩාත් නරක අතට හැරී ඇති හෙයින් ද,

ජල ගැල්ම පහව යාමෙන් පසුව සියළු දෙයම අමතක කර දැමීමේ ප්‍රවණතාවක් ඇති හෙයින් ද,

මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් වන හෙයින් ද,

(අ) කොළඹ නගරයේ හා ඒ අවටද, එම දිස්ත්‍රික්කයේ ද යළි යළිත් ජල ගැලීම් ඇතිවීමට හේතු විමසා බැලීමට ද;

(ආ) ඉහත කී පරිදි ජල ගැලීම් ඇති වීම වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික හා කෙටි කාලීන ක්‍රියා මාර්ග පිළිබඳව විමසා බැලීමට ද;

(ඇ) මෙම ගැටළුව යළි යළිත් ඇතිවීම ස්ථිරව ම වැළැක්වීමේ ක්‍රම සහ විධි නිර්දේශ කිරීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2\. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3\. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ හා ප්‍රවීනයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4\. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 58/’10

4\.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා,— මැතිවරණ නීති සමාලෝචනය කිරීම හා සංශෝධන නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය වර්ෂ ගණනාවක් මුළුල්ලේ විවිධාකාර ප්‍රයත්නයන් දරා ඇති හෙයින්ද,

5 වැනි පාර්ලිමේන්තුව කාලයේදී හා ඉන් අනතුරුව 2006, 6 වැනි පාර්ලිමේන්තුව කාලයේදී ද ඇතුළුව, අවස්ථා ගණනාවකදී මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසා බැලීම සඳහා විශේෂ කාරක සභා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභා විසින් අන්තර්වාර වාර්තා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙයින් ද,

(අ) මැතිවරණ සම්බන්ධ නීති, විශේෂයෙන්ම ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත, පළාත් පාලන මැතිවරණ පනත, පළාත් සභා මැතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ජනාධිපති මැතිවරණ පනත හා සමඟ ඉහත කී පනත්වලට වසර ගණනාවක් පුරා සිදුකරන ලද විවිධ සංශෝධනද ඉහත දක්වා ඇති පනත්වල විධිවිධාන වලට අදාළ කරන ලද විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත්ද සමාලෝචනය කිරීමටත්;

(ආ) මෙම පනත් ප්‍රතිශෝධනය කිරීමට, සංශෝධනය කිරීමට හා ඒකාබද්ධ කිරීමට ඇති අවශ්‍යතාව තක්සේරු කිරීමටත්;

(ඇ) මැතිවරණවලට අදාළව දැනට පවත්නා නීති වලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ සංශෝධන නිර්දේශ කිරීමටත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධාන වල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 61/'10

5.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය,— දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීම හා එය ක්‍රියාත්මක කිරීම සඳහා තවදුරටත් සංශෝධන අවශ්‍ය වන්නේද යන්න පිළිබඳව වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2001 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර සහතික කරන ලද හෙයින් ද;

රාජ්‍ය පරිපාලන සහ අධිකරණ නියෝජිත ආයතන ගණනාවක ස්වාධීනත්වය සහතික කරනු පිණිස වූ වැදගත් විධිවිධාන ගණනාවක් ඉහත කී සංශෝධනයෙහි විධිවිධාන මගින් හඳුන්වාදුන් හා එම විධිවිධානවලට අන්තර්ගත වූ හෙයින් ද;

ඉහත කී සංශෝධන මගින් සාධාරණ හා නිදහස් සමාජයක් සහතික කිරීම චේතනය කරන ලද හෙයින් ද;

දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන උල්ලංඝනය වන බව නිරීක්ෂණය කරනු ලැබ ඇති හෙයින් ද;

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීමට ද;

(ආ) එහි විධිවිධාන අනුගමනය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර නිර්දේශ කිරීමට ද;

(ඇ) තවදුරටත් සංශෝධන අවශ්‍ය වන්නේද යන්න සලකා බැලීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට බලය තිබිය යුතුය.

(ඈ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කරගැනීමට, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමටද බලය තිබිය යුතුය.

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට බලය තිබිය යුතුය.

4. කාරක සභාව, සිය පළමුවැනි රැස්වීම් දිනයෙහි සිට එක් වර්ෂයක් හෝ පාර්ලිමේන්තුව ලබා දෙන්නාවූ එවැනි අන් කවර හෝ නැතහොත් දීර්ඝ වූ හෝ කාල සීමාවක් තුළ සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 66/'10

6.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මංගල සමරවීර මහතා,— රාජ්‍ය මූල්‍යය පිළිබඳ කාරක සභාව,—

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වන්නා වූ ද, එසේ වුවද සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නා වූ ද, රාජ්‍ය මූල්‍යය පිළිබඳ කාරක සභාව යැයි හැඳින්විය යුතු කාරක සභාවක් වන්නේය.

2. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම ද;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීම ද;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව යටතේ, නීතිය ප්‍රකාරව විශේෂිත පරමාර්ථ සඳහා රාජ්‍ය අරමුදල් උපයෝජනය කිරීම ද;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) සහ 150(2) ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය අරමුදල් භාවිතා කිරීම ද;

(ඉ) විසර්ජන පනතේ ඇතුළත් වන විසර්ජනයන් ප්‍රවර්තන වර්ෂය සඳහා ආපසු ගැනීම්, විසර්ජනයන් මාරු කිරීම් සහ අනපේක්ෂිත ශේෂය මාරු කිරීම ද;

(ඊ) ප්‍රවර්තන වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම ද;

(උ) රාජ්‍ය ණය සහ ණය පොලී ගෙවීම ද;

(ඌ) 2003 අංක 2 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශ ද;

පරීක්ෂා කිරීම එකී කාරක සභාවේ කාර්යය වන්නේය.

3. ඉහත 2 ඡේදයෙහි සඳහන් වන කරුණු වලින් පැන නගින කරුණු සම්බන්ධයෙන් කාරක සභාව වරින් වර පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

4. අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සභාගත කරනු ලැබීමෙන් පසු සති 6ක් ඇතුළත කාරක සභාව, රජයේ ප්‍රතිපත්ති සීමාවන් ඇතුළත නිසි පරිදි මුදල් වැය කරනු ලැබේ ද යන්න සඳහන් කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේය.

5. අයවැය ඉදිරිපත් කරනු ලැබීමෙන් ඉක්බිතිව විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමෙන් පසු දින 4ක් ඇතුළත කාරක සභාව, සමස්ත ඇස්තමේන්තුගත වියදම් සහ ලැබීම් නිගමනය කිරීමේදී පදනම් වශයෙන් භාවිත කරනු ලබන රාජ්‍ය මූල්‍ය, මූල්‍ය සහ ආර්ථික උපකල්පනයන් පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

පා. 67/'10

7.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මංගල සමරවීර මහතා,— අධීක්ෂණ ස්ථාවර කාරක සභා,—

(අ) පහත ලැයිස්තුගත කර ඇති පරිදි, තම බල සීමාව යටතට එන විෂයයන්ට අදාළ සියලු පනත් කෙටුම්පත්, යෝජනා, ගිවිසුම්, වාර්තා හා අනෙකුත් කරුණු පරීක්ෂා කිරීමේ බලතල සහ බල සීමාවන් පහත දක්වා ඇති එක් එක් කාරක සභාවට පැවරෙන "අධීක්ෂණ ස්ථාවර කාරක සභා" යනුවෙන් හැඳින්වෙන කාරක සභා පාර්ලිමේන්තුවේ තිබිය යුතු යැයිද,

(ආ) එකී කාරක සභාවල බල සීමාව යටතට එන සියලු පනත් කෙටුම්පත්, යෝජනා, ගිවිසුම්, වාර්තා සහ අනෙකුත් කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් වාර්තා කිරීම සඳහා අදාළ කාරක සභාවලට යොමු කළ යුතු යැයිද,

මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

1. ජාත්‍යන්තර සබඳතා
ජාත්‍යන්තර වෙළඳාම ඇතුළුව විදේශ රැකියා, ජාත්‍යන්තර සංවිධාන, ජාත්‍යන්තර සම්මේලන සහ ගිවිසුම්, කලාපීය සංවිධාන

2. ජාතික ආරක්ෂාව
ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ඇතුළුව සන්නද්ධ හමුදා, රහස් තොරතුරු, මහජන නීතිය හා සාමය, පොලිසිය හා ආරක්ෂාව, විදේශීය රටවල් සමඟ සහයෝගීතාව

3. කෘෂිකර්ම සහ ඉඩම්
වැවිලි කර්මාන්ත, මහවැලි අධිකාරිය, ඉඩම් සහ වාරිමාර්ග ඇතුළුව

4. මානව සම්පත් හා සංස්කෘතිය
අධ්‍යාපනය, පුහුණුව, තරුණ කටයුතු, ක්‍රීඩා, සංස්කෘතිය හා ආගමික කටයුතු ඇතුළුව

5. මානව ජනාවාස හා බල ශක්තිය
නාගරික හා ග්‍රාමීය යටිතල ව්‍යුහයක්, මහා මාර්ග, මාර්ග, දුම්රිය, නැව් කටයුතු, ගුවන් සේවා, තැපැල් සහ විදුලි සංදේශ

6. මානව සුබ සාධනය
සෞඛ්‍යය, සමාජ සුබ සාධනය, දරිද්‍රතාව දුරලීම, අබාධිතයින්, ජ්‍යෙෂ්ඨ පුරවැසි හා ළමා සුබ සාධනය ඇතුළුව

7. අභ්‍යන්තර පරිපාලනය

8. පරිසර හා ස්වාභාවික සම්පත්

ජල කළමනාකරණය, ජලජ සම්පත්, විශේෂිත ආර්ථික කලාපය හා ධීවර කටයුතු ඇතුළුව

9. නෛතික හා කාන්තා කටයුතු
අධිකරණ, මානව හිමිකම්, මාධ්‍ය, කම්කරු, ජාතික ඒකාබද්ධතා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළුව

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(ඇ) සහ 45(1) ව්‍යවස්ථා යටතේ අමාත්‍යාංශ වලට පවරා ඇති විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු හා ආයතන, ව්‍යවස්ථාදායක අධීක්ෂණ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය ස්ථාවර කාරක සභාවට වෙන් කරනු ලබන්නේය.

2 (අ) (i) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති භාවිතය, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම හා ඵලදායී බව; සහ

(ආ) නව හෝ අතිරේක නීති පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි තත්ත්වයන් සහ අවස්ථා;

සම්බන්ධයෙන් සිය විශ්ලේෂණ ඇගයීම් කාර්යයේ දී ද; සහ

(ii) නීති හා අවශ්‍ය සහ යෝග්‍ය විය හැකි පරිදි එවැනි අතිරේක නීති සකස්කිරීමේදී සලකා බැලීමේදී හා නීති පැනවීමේදී හෝ වෙනස් කිරීමේදී ද;

පාර්ලිමේන්තුවට සහාය වීම පිණිස (ආ) ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි එකී විවිධ අධීක්ෂණ ස්ථාවර කාරක සභා වලට පොදු අධීක්ෂණ වගකීම් තිබිය යුත්තේය.

(ආ) කාරක සභාවක බල සීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති හා වැඩසටහන් පාර්ලිමේන්තුවේ අභිප්‍රායට අනුකූලව ක්‍රියාත්මක වන්නේද සහ ඉටු වන්නේද යන්න හා ඒවා දිගටම පවත්වා ගත යුතුද, සීමා කළ යුතුද නැතහොත් බැහැර කළ යුතුද යන්න තීරණය කරනු පිණිස සෑම ස්ථාවර කාරක සභාවක්ම අඛණ්ඩ පදනමක් මත—

(i) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදනය ව්‍යාපෘති සහ වැඩසටහන් යෙදවුම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම හා ඵලදායී බව;

(ii) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන සහ වැඩසටහන් පාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම ඇති දෙපාර්තමේන්තු හා ආයතන වල සංවිධානය හා මෙහෙයුම;

(iii) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළව නව හෝ අතිරේක ව්‍යවස්ථා පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි කවර හෝ තත්ත්වයන් හෝ අවස්ථා (එයට අදාළව පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් හඳුන්වා දෙනු ලැබ ඇතිව හෝ නැතිව වුවද); සහ

(iv) සිය බල සීමාවට ඇතුළත් වන විෂයයන් පිළිබඳ අනාගත පර්යේෂණ හා පුරෝකථන;

අධීක්ෂණය කළ යුත්තේය.

(ඇ) සෑම කාරක සභාවක්ම විසින් සිය වගකීම් ඉටු කිරීමේදී අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි හෝ එය සලකන පරීක්ෂණ හෝ අධ්‍යයනයන් කවර හෝ අවස්ථාවක සිදු කිරීමට එක් එක් කාරක සභාවට හැකිය.

(ඇ) පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයෙහි ආරම්භයෙන් පසු සති හයකට නොවැඩි කාලයකදී එක් එක් ස්ථාවර කාරක සභාව, එම පාර්ලිමේන්තුව සඳහා සිය අධීක්ෂණ සැලැසුම සකස් කළ යුත්තේය. එකී සැලසුම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුත්තේය. සිය සැලැස්ම සකස් කිරීමේදී එක් එක් කාරක සභාව, හැකි තාක් දුරට—

(i) එකී ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් හෝ නියෝජිතායතන පිළිබඳ සමාලෝචන සිදුකිරීමේදී කාරක සභා අතර උපරිම සම්බන්ධීකරණය සහ සහයෝගය සහතික කිරීමේ අරමුණින් සමාන හෝ සම්බන්ධ ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් පිළිබඳ බල සීමාව සහිත අනෙකුත් කාරක සභා හෝ තම බල සීමාවට අයත් නියෝජිතායතන හෝ විමසා බැලිය යුතු අතර එකී සම්බන්ධීකරණය සහ සහයෝගය සහතික කරනු පිණිස ගනු ලැබ ඇති හෝ ගනු ලබන පියවර පැහැදිලි කිරීමක් සිය සැලසුමෙහි අන්තර්ගත කළ යුත්තේය;

(ii) නොපැහැදිලි, අත්තනෝමතික හෝ අර්ථයක් නැති හෝ පුද්ගලයන් මත උග්‍ර මූල්‍ය බර පටවනු ලබන ආණ්ඩුවේ රීති රෙගුලාසි, ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ පිළිබඳව නිශ්චිත ගැටලු සමාලෝචනය කළ යුත්තේය;

(iii) ස්ථිර අය වැය අධිකාරිය හෝ ව්‍යවස්ථාපිත අධිකාරිය හෝ යටතේ ක්‍රියාත්මක වන එකී ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් හෝ නියෝජිතායතන පිළිබඳ සමාලෝචන සිය සැලැස්මේ අන්තර්ගත කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුත්තේය; සහ

(iv) සිය බල සීමාවට අයත් සියලු වැදගත් ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩසටහන් හෝ නියෝජිතායතන සෑම වසර 10 කට වරක්ම සමාලෝචනයකට භාජන කරන බවට සහතික කිරීමට කටයුතු කළ යුත්තේය.

(ඉ) පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිය ආරම්භයෙන් පසු සති නවයකට නොවැඩි කාලයකදී, කාරක සභා විසින් ඉදිරිපත් කරනු ලැබූ අධීක්ෂණ සැලසුම් සහ එකී අධීක්ෂණ සැලැසුම් වඩාත්ම ඵලදායී ලෙස සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා සහ නැතහොත් මේ අනු ඡේදයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, එමගින් කිරීමට ඉඩ ඇති යම් නිර්දේශ වේ නම් ඒවාද සමගින්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේය.

3 (අ) කවර හෝ විෂයයක් යම් ස්ථාවර කාරක සභාවකට යොමු කිරීමට පාර්ලිමේන්තුවට හැකිය.

(ආ) අමාත්‍යවරයා යටතේ ඇති විෂයයක්, කර්තව්‍යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් පිළිබඳ අධිකාරී බලය ඇති අදාළ අධීක්ෂණ ස්ථාවර කාරක සභාවට යම් කරුණක් යොමු කිරීමට අමාත්‍යවරයාට හැකිය.

4 (අ) මෙම ඡේදයේ විධිවිධාන අනුව එම 1(අ) ඡේදය යටතේ නම් කර ඇති අධීක්ෂණ ස්ථාවර කාරක සභාවක් යටතේ ලැයිස්තු ගත කරන ලද විෂයයකට අදාළ සෑම පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනාවක් හෝ අනෙකුත් කරුණක් කථානායකවරයා එයට යොමු කළ යුත්තේය.

(ආ) 1(අ) ඡේදයේ විධිවිධානයක ඇති විෂය කරුණක් සම්බන්ධයෙන් අධිකාරී බලය ඇති එක් එක් කාරක සභාවට එකී විධිවිධානය සලකා බලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට හැකිතාක් දුරට හැකිවන ආකාරයට කථානායකවරයා 4(අ) ඡේදය යටතේ කරුණු යොමු කළ යුත්තේය.

(ඇ) කිසියම් කරුණක් යොමුකිරීම සම්බන්ධයෙන් ඉහත (අ) සහ (ආ) ඡේද ක්‍රියාත්මකකිරීමේදී, කථානායකවරයා:—

(i) ප්‍රාථමික බලසීමාව ඇති කාරක සභාවක් නම් කළ යුත්තේය.

(ii) ප්‍රාථමික බලසීමාව ඇති කාරක සභාවේ මතය විමසීම සඳහා කරුණු යොමුකිරීමට පෙර හෝ පසු, එම කරුණු තවත් අතිරේක කාරක සභා එකකට හෝ වැඩි සංඛ්‍යාවකට හෝ යොමු කළ හැකිය.

(iii) යොමුකිරීමක් යෝග්‍ය කාල සීමාවකට යටත් කළ හැකිය; සහ

(iv) යෝග්‍යයැයි හැඟෙන පරිදි එබඳු අනෙකුත් විධිවිධාන සකස් කළ හැකිය.

(ඈ) මතයත්, ප්‍රකාශ කරන කාරක සභාවේ වගකීම් ක්ෂේත්‍ර යටතට ගැනෙන කරුණු පමණක් මතයට විෂය විය යුත්තේය.

(ඉ) ප්‍රාථමික බල සීමා කාරක සභාවේදී සලකා බැලිය යුතු වේ නම්, මතය විමසා සිටින කාරක සභාව ඉල්ලා සිටින කාල සීමාව තුළ එය ලබා දීම සඳහා ප්‍රාථමික බල සීමා අධිකරණය අවසන් කාල සීමාවක් නියම කළ යුත්තේය.

5 (අ) සිය බල සීමාව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමේදී, එක් එක් කාරක සභාව එකී කාරක සභාව විසින් සලකා බලන ලද එක් එක් විෂයයට අදාළ වාර්තාවක් කථානායකවරයාට ඉදිරිපත් කළ යුත්තේය. එකී වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කථානායකවරයා කටයුතු කළ යුත්තේය.

(ආ) (i) කිසියම් පනත් කෙටුම්පතක් හෝ නියෝගයක් පිළිබඳව කාරක සභාවක ඕනෑම වාර්තාවක් ක්ෂණික සාධාරණීකරණය අනුව යෝග්‍ය වේ නම් ඒ සමග දැක්වෙන යෝජනාවට යම් කෙටුම්පත් සංශෝධනයක් අවශ්‍ය නම් එයින් සමන්විත විය යුත්තේය.

(ii) කෙටුම්පතක් සඳහා වන එබඳු ඕනෑම සංශෝධනයක්, කාරක සභාවේ සභාපතිවරයා හෝ කාරක සභාව විසින් නම් කරනු ලැබූ එහි වෙනත් සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ සංශෝධනයක් ලෙස, එකී පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී ස්ථාවර නියෝග 56 යටතේ කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

(iii) නියෝගයක් සඳහා වන එබඳු ඕනෑම සංශෝධනයක්, කාරක සභාවේ සභාපතිවරයා විසින් හෝ කාරක සභාව විසින් නම් කරනු ලැබූ එහි වෙනත් සාමාජිකයෙකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක් ලෙස, කථානායකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) පාර්ලිමේන්තුව හමුවේ තබන ලද කිසියම් ව්‍යවස්ථාදායක නොවන වාර්තාවක නිර්දේශ, පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් මගින් අනුමත කරනු ලැබිය හැකිය.

6 (අ) එක් එක් කාරක සභාව සිය රැස්වීම් පිළිබඳ දින දර්ශනයක් සකස් කර එය කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) සෑම කාරක සභාවක්ම මසකට දින දෙකකට නොඅඩු දින ගණනක රැස් විය යුත්තේය. දින දර්ශනය/කාල සටහන කථානායකවරයා විසින් අනුමත කරනු ලැබීමෙන් පසු එක් එක් ස්ථාවර කාරක සභාවේ රැස්වීම් පවත්වනු ලැබිය යුත්තේය.

(ඇ) යම් ස්ථාවර කාරක සභාවක අතිරේක රැස්වීම් පාර්ලිමේන්තුවේ ඉල්ලීම පරිදි හෝ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයන්ගෙන් අඩක් විසින් කරනු ලැබූ ඉල්ලීම පරිදි හෝ කැඳවනු ලැබිය යුත්තේය.

(ඈ) ස්ථාවර කාරක සභාවක් වෙත යොමු කොට ඇති යම් කරුණක ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක සංඛ්‍යාවක් විසින් ලිඛිතව එකී කාරක සභාවෙන් ඉල්ලා සිටිය හැකිය. එවන් ඉල්ලීමක් ලැබී සති දෙකක කාලයක් ඇතුළත එකී කාරක සභාව පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එකී වාර්තාව පාර්ලිමේන්තුවේ සභාභිමුඛ කරනු ලබන්නේය.

7 සෑම ස්ථාවර කාරක සභාවක්ම පාර්ලිමේන්තු කාලසීමාව තුළ ක්‍රියාත්මක වේ.

8 (අ) පහත දැක්වෙන අය හැර අනෙකුත් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ස්ථාවර කාරක සභාවන්හි සාමාජිකයින් ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලබති:

(i) කථානායකවරයා

(ii) නියෝජ්‍ය කථානායකවරයා

(iii) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා

(iv) අග්‍රාමාත්‍යවරයා

(v) සභානායකවරයා

(vi) විපක්ෂනායකවරයා

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලැබ ඇති කැබිනට් අමාත්‍යවරයන්

(viii) සිය අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් කැබිනට් අමාත්‍යවරයකුගේ විෂය පථය යටතට නොගැනෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(1) ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන් හෝ 45(4) ව්‍යවස්ථාව යටතේ විෂයයන් හා කාර්යයන් පවරනු ලැබ නොමැති අමාත්‍යවරයන්

(ආ) සුදුසුකම් ඇති සෑම මන්ත්‍රීවරයෙකුම එක් ස්ථාවර කාරක සභාවක සාමාජිකයකු ලෙස කටයුතු කළ යුත්තේය. එම 8(අ)(viii) ඡේදය යටතට නොගැනෙන නියෝජ්‍ය අමාත්‍යවරයන් සහ අමාත්‍යවරයන්, එකී නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා කටයුතු කරන්නේ තම කැබිනට් අමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන යම් විෂයයක්, කර්තව්‍යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් ද, එකී විෂය පථයන් සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට පැවරී ඇති යම් ස්ථාවර කාරක සභාවක කටයුතු නොකළ යුත්තේය.

(ඇ) (i) සුදුසුකම් ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනයක් කථානායකවරයා විසින් සකස් කළ යුත්තේය.

(ii) සුදුසුකම් ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනයේ සංඛ්‍යාත්මක අගය අනුව එක් එක් කාරක සභාවට අයත් ස්ථානය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත ලබා දෙනු ලැබිය යුත්තේය.

(ඈ) පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම් වල නායකයින් විසින් එක් එක් ස්ථාවර කාරක සභාවේ සාමාජික නාම යෝජනා කථානායකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය. තේරීම් කාරක සභාවේ අදහස් විමසා බලා කථානායකවරයා විසින් එකී නම් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුත්තේය.

(ඉ) 8(ඈ) ඡේදය යටතේ නම් කරන ලද ඕනෑම සාමාජිකයකු එකී ස්ථාවර කාරක සභාවෙන් ඉවත් කරන ලෙසට කථානායකවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ නායකයකුට හැකිය. එවැනි ඉල්ලීමක් ලැබීමෙන් පසු එය පාර්ලිමේන්තුවට දැනුම්දීමෙන් අනතුරුව කථානායකවරයා අදාළ මන්ත්‍රීවරයා එකී කාරක සභාවෙන් ඉවත් කළ යුත්තේය.

(ඊ) (i) සෑම ස්ථාවර කාරක සභාවක්ම සිය පළමු රැස්වීමේදී සහ සභාපති ධූරය පුරප්පාඩු වූ පසු එළඹෙන පළමු රැස්වීමේදී ස්ථාවර කාරක සභාවේ සභාපතිවරයකු පත් කර ගත යුත්තේය.

(ii) අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු ස්ථාවර කාරක සභාවක සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

(උ) කාරක සභාවේ රැස්වීම් වලට නොකඩවා තුන් වාරයක් සහභාගී නොවන මන්ත්‍රීවරයෙකු එකී කාරක සභාවේ සාමාජිකත්වය හැර ගියා සේ සලකනු ලබන්නේය.

9 අවශ්‍යයැයි හැඟෙන කරුණු පරීක්ෂා කර බලා කාරක සභාවට වාර්තා කිරීම සඳහා, අවශ්‍යයැයි එය සලකන අවස්ථාවලදී සිය සාමාජිකයන්ගෙන් සමන්විත වන අනු කාරක සභා පත් කිරීමට එක් එක් අධීක්ෂණ කාරක සභාවට හැකිය.

10 අධීක්ෂණ කාරක සභාවක් වෙත යොමු කරන ලද කරුණු අදාළ යොමු කිරීමෙන් මාස 3 ක් ඉකුත් වීමට පෙර පාර්ලිමේන්තුව විසින් සැලකිල්ලට භාජනය නොකළ යුත්තේය. එසේ

වුවද, යම් නිශ්චිත කරුණක් පිළිබඳව වාර්තා කිරීමට පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් මගින් අදාළ කාල සීමාව දීර්ඝ කරනු ලැබ ඇති අවස්ථාවකදී එකී කාල සීමාව ඉකුත් වීමෙන් පසු පමණක් එකී කරුණ සලකා බලනු ලැබිය යුත්තේය.

11 පනත් කෙටුම්පතක් හෝ පොදු වැදගත්කමක් ඇති වෙනත් කරුණක් හෝ සම්බන්ධයෙන් කටයුතු කරන ස්ථාවර කාරක සභාවකට, එකී පනත් කෙටුම්පත හේතුවෙන් අගතියට පත්වන පාර්ශවයන්, ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හෝ ඒ පිළිබඳ අත්දැකීම් ඇති පුද්ගලයින් සාක්ෂි සඳහා කැඳවීමට හැකිය.

12. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ සඳහන් පනත් කෙටුම්පතක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලබන සංශෝධනයක් හැර වෙනත් නීතියක් පැනවීම අධීක්ෂණ ස්ථාවර කාරක සභා වාර්තාවක් විසින් නිර්දේශ කරනු ලබන අවස්ථාවකදී එකී පරමාර්ථ සඳහා වාර්තාවේ විශේෂිතව සඳහන් කරනු ලබන කාරක සභාවේ සභාපතිවරයා හෝ වෙනත් සාමාජිකයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර, දැනුම් දීමෙන් අනතුරුව, පාර්ලිමේන්තුවේ නියමයකින් තොරව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී පළමුවැනි වර කියවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. පනත් කෙටුම්පතේ පිටපත් යෝජනාව සමග ඉදිරිපත් කළ යුතුය. යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් සති හයක් ඇතුළත ඡන්දයක් සඳහා කථානායකවරයා විසින් එම යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය. එසේ වුවද එකී සති හයක කාල සීමාව විසර්ජන පනත් කෙටුම්පතේ දෙවැනි වර කියවීමේ හෝ කාරක සභා අවස්ථාවේ හෝ තුන්වැනි වර කියවීමේ කාල සීමාව තුළ යෙදෙන්නේ නම්, එකී යෝජනාව පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුත්තේ විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම අවසන් වූ පසුවය. එකී යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීමෙන් ඉක්බිතිව පනත් කෙටුම් පත පළමුවැනි වර කියවා මුද්‍රණය කිරීම සඳහා නියෝග කරනු ලැබිය යුත්තේය.

එසේ වුවද, එකී පනත් කෙටුම්පත අධීක්ෂණ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයින්ගෙන් 2/3ක සාමාජික සංඛ්‍යාවක් විසින් අනුමත කරනු ලැබිය යුතු අතර එකී සාමාජිකයින්ගේ නම් සමග එය වාර්තා කරනු ලැබිය යුත්තේය.

(ආ) පනත් කෙටුම් පත පළමුවැනි වර කියවා මුද්‍රණය කිරීමට නියෝගය ලබා දීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලය විසින් ඒ පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ලබා දෙන තුරු ඒ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා නොකළ යුත්තේය.

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ලබා දෙනු ලැබීමෙන් පසු හෝ පනත් කෙටුම් පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දින සිට මාස දෙකක කාලයක් ඉකුත් වීමෙන් පසු පනත් කෙටුම් පත දෙවැනි වර කියවීම සඳහා නියම කළ යුත්තේය.

13 (අ) පුද්ගලයින්, ලිපි ලේඛන හා වාර්තා කැඳවීමට සෑම ස්ථාවර කාරක සභාවකටම බලතල තිබෙන අතර, ඔවුන් ඉදිරියේ ගනු ලැබූ සාක්ෂි වල කාර්යය සටහන් සමඟ, ඔවුන්ගේ අදහස් හා නිරීක්ෂණයන්ද සහිතව එක් එක් කාරක සභාව පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) ස්ථාවර කාරක සභාවක සාමාජිකයකුගේ විරෝධතාවයක් හෝ වෙනස් මතයක් එකී කාරක සභාවේ වාර්තාවට ඇමිණිය හැකිය.

14 (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 වැනි ව්‍යවස්ථාවේ දැක්වෙන ව්‍යවස්ථා පැනවීම ස්ථාවර කාරක සභාවක් විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම අවස්ථාවකදී එකී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් මාස තුනක කාලයක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය ඒ සම්බන්ධයෙන් සිය මතය ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) ස්ථාවර කාරක සභාවක වාර්තාවක් ව්‍යවස්ථා පැනවීම සම්බන්ධ වාර්තාවක් නොවන අවස්ථාවකදී, එකී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් මාස දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය සිය මතය ඉදිරිපත් කළ යුත්තේය. එවැනි වාර්තාවක් පාර්ලිමේන්තුව විසින් සලකා බලනු නොලබන්නේය.

15 යම් නීතියක් යටතේ යම් ආයතනයක්, සංගමයක්, නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු විසින් පෞද්ගලිකත්වය හෝ රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු අවස්ථාවකදී, අදාළ ස්ථාවර කාරක සභාව එකී නීතිය ප්‍රකාරව කටයුතු කළ යුත්තේය.

16 (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වැනි ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන මහජන ආරක්ෂාව සම්බන්ධ ඕනෑම නියෝගයක් සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා නෛතික හා කාන්තා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව වෙත යොමුකොට වාර්තාවක් ලබා ගත යුත්තේය. යම් නියෝගයක ලුහුඬු නාමය වෙනත් කාරක සභාවක බල සීමාව යටතේ එන නිශ්චිත විෂයයක් හා සම්බන්ධ වේ නම්, එම 4(ඇ)(ii) ඡේදය යටතේ කථානායකවරයා එකී නියෝග අදාළ කාරක සභාවට යොමු කළ යුත්තේය.

(ආ) (අ) ඡේදය යටතේ කරනු ලබන සඳහනට 7 ඡේදය අදාළ නොවන්නේය.

17 කථානායකවරයාගේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, වෙනත් කාරක සභා එකක් හෝ වැඩි ගණනක් සමග සාකච්ඡා පැවැත්වීමට ඕනෑම අධීක්ෂණ ස්ථාවර කාරක සභාවකට හැකිය.

18 කවර හෝ විසර්ජනයන් හෝ වැය නොකරන ලද ශේෂයක් පැවරීම පිළිබඳව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, අයවැය අධ්‍යක්ෂ සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම් රාජ්‍ය මූල්‍ය කාරක සභාවට වහාම දැනුම් දිය යුත්තේය.

19 බල සීමාව යන්නෙන් ව්‍යවස්ථාදායක අධීක්ෂණ බල සීමාව අදහස් වන අතර අනු ව්‍යවස්ථාවන් සම්බන්ධයෙන් වන බල සීමාවද ඊට ඇතුළත් වේ.

ඕනෑම විසර්ජනයක් හෝ වැය නොකරන ලද ශේෂයක් හෝ මාරු කිරීමේදී අදාළ අමාත්‍යාංශයේ ලේකම් ඒ බැව් වහාම අදාළ අධීක්ෂණ කාරක සභාව වෙත දැනුම් දිය යුත්තේය.

20. 8(අ) හා (ඊ)(ii) ඡේද රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අදාළ වන්නේය.

පා.106/' 10

8.

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු හුනෙයිස් ෆාරූක් මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු වී. කේ. ඉන්දික මහතා

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජය දහනායක මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු ගුණරත්න වීරකෝන් මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු ෆීලික්ස් පෙරේරා මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු නියෝමාල් පෙරේරා මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු පවිත්‍රා දේවී වන්නිආරච්චි මහත්මිය

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු දයාශ්‍රිත තිසේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීම පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, —

මෙම ගරු සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා 2010 නොවැම්බර් මස 29 වැනි දින හා ඊට පෙර දිනයන්හිදී එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් විසින් ලන්ඩන් නගරයේදී ශ්‍රී ලංකා රජයට හා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එරෙහිව පවත්වන ලද රැස්වීම්, විරෝධතා ව්‍යාපාර, සාකච්ඡා සඳහා ඍජුව සහ / හෝ වක්‍රව සහභාගී වී ඇති බවට එකී සාකච්ඡා, විරෝධතා සඳහා ඍජුව හෝ වක්‍රව සහ/ හෝ අනුබල දී ඇති සහ අනුග්‍රහ දක්වා ඇති බවට වාර්තා ලැබී ඇති හෙයින්ද,

එකී විරෝධතාවයන් සංවිධානය කිරීමට අදාළ මූලික සාකච්ඡාවන් හා උනන්දු කිරීමේ රැස්වීම් හා ඊට අදාළ දැනුවත් කිරීම් සඳහාද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා සෘජුව සහභාගී වී ඇති බව වාර්තාවී ඇති හෙයින්ද,

මීට පෙරද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ එහි හිතවතුන් සමඟ විවිධ ආකාරයේ සම්බන්ධතාවයන් පවත්වාගෙන ගිය බවට කරුණු හෙළිදරව් වී ඇති බැවින්ද,

ලන්ඩනය හා යුරෝපයේ වෙනත් ප්‍රධාන නගරවල එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් සහ/ හෝ එල්.ටී.ටී.ඊ. ආධාරකරුවන් සමග ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා පවත්වා ඇති බව හා පවත්වාගෙන යන බවට කරුණු හෙළිදරව් වී ඇති බැවින්ද,

ඉහත කී ක්‍රියාවන් එකකින් හෝ වැඩි ගණනක් තුළින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ ව්‍යවස්ථාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හය වැනි සංශෝධනය හා දිවුරුම පැහැදිලිවම උල්ලංඝනය කර ඇති බව පෙනී යන හෙයින්ද,

ඉහත කී කරුණු සම්බන්ධයෙන් හා ඉහත කී කරුණුවලට අදාළව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතාගේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂා කර බලා මෙම ගරු සභාවට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. තවද,—

(අ) එකී කාරක සභාවට සාමාජිකයන් නම් කිරීම හා සභාපතිවරයා පත් කිරීම කථානායකවරයා විසින් කළ යුතු බවත්,

(ආ) එකී කාරක සභාවට ස්වකීය ගණපූරණය නියම කිරීමටත්,

(ඇ) අවශ්‍ය පුද්ගලයින් කැඳවීමට හා අවශ්‍ය ලිපි ලේඛනාදිය ගෙන්වා ගැනීමට සහ

(ඇ) දිවුරුම් පිට සාක්ෂිකරුවන් විභාග කිරීමටත්

කාරක සභාවට බලය තිබිය යුතුය.

3. වරින් වර වාර්තා කිරීමටත්, පාර්ලිමේන්තු සැසිවාරය කල් තබනු ලැබුවත්, රැස්වීම් පවත්වාගෙන යාමටත්, එකී කාරක සභාවට බලය තිබිය යුතුය.

පා.107/’10

9.

ගරු කරු ජයසූරිය මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— එංගලන්තයේ “හීත්‍රෝ” ගුවන් තොටුපළේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරවලට මෙම ගරු සභාවේ කිසියම් මන්ත්‍රීවරයෙකු සම්බන්ධ වී සිටියේද යන්න සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2010 දෙසැම්බර් මස 02 වැනි දින ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුව හමුවේ,

"මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව දිවුරුම් දුන් මන්ත්‍රී කෙනෙක් තහනම් කළ සංවිධානයක් එක්ක නීති විරෝධී කණ්ඩායම් සමග අතිගරු ජනාධිපතිතුමා පැමිණෙන වේලාවට එංගලන්තයේ ගුවන් තොටුපළට ගිහිල්ලා අපේ රටටත්, ඒවාගේම තමන්ගේ දිවුරුම් දීමටත් විරුද්ධව වැඩ කළා නම්, ඒ මන්ත්‍රීතුමාව මේ සභාව විසින් වහාම පරීක්ෂණයකට ලක් කළ යුතුයි"

යනුවෙන් ප්‍රකාශයක් කර ඇති බැවින් ද;

ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් මතු කරන ලද කරුණු මෙම සභාවේ බරපතළ පරීක්ෂණයකට භාජනය කළ යුතු බැවින් ද;

ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි,

(අ) ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් එල්ල කරන ලද චෝදනාවේ පසුබිමට හේතු වූ කරුණු; සහ

(ආ) එංගලන්තයේ "හීත්‍රෝ" ගුවන් තොටුපළේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරවලට මෙම ගරු සභාවේ කිසියම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සම්බන්ධ වී සිටියේ ද යන්න සොයා බලා වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි යෝජනා කර සිටිමු.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඇ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමටද, යම් ලේඛණයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, රැස්වීම් පවත්වාගෙන යෑමටද බලය තිබිය යුතුය.

පා.121/'11

10.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා 2011 ජනවාරි මස 04 වැනි දින,

"අද වෙලා තිබෙන්නේ මේකයි. 2011 අප්‍රේල් 01 වැනිදා අපි පළාත් පාලන ආයතනවල අලුත් සභාවාරය කැඳවන්න ඕනෑ. ඒකට ඇත්තටම මාර්තු මාසයේ ඡන්දය තියන්න වෙනවා."

යැයි පැවසූ විට පළාත් පාලන ආයතනවල නව කාල සීමා 2011 අප්‍රේල් මස 01 වැනි දින ආරම්භ වීමට නියමිත හෙයින් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් 2011 මාර්තු මස පැවැත්වෙනු ඇති බව එතුමා සභාවට සහතික වූ හෙයින් ද;

කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ දෙහිවල - ගල්කිස්ස මහනගර සභාවල හා කොළොන්නාව නගර සභාවේ ඡන්ද විමසීම් දැන් කල්දමනු ලැබ ඇති හෙයින් හා තවත් මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල ඡන්දද කල් දමනු ලැබීමට නියමිත බව වාර්තා වී ඇති හෙයින් ද; හා

අමාත්‍යවරයා උවමනාවෙන්ම අසත්‍ය ප්‍රකාශයක් කරමින් සභාව නොමග හැරිය හෙයින් ද;

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා ලෙස සිය කාර්යයන් ඉටුකිරීම තවදුරටත් කරගෙන යාමට අමාත්‍යවරයා සතු හැකියාව කෙරෙහි සභාවේ විශ්වාසය ගිලිහී ඇති බවට හා අමාත්‍ය මණ්ඩලයේ ධුරයක් හෙබවීම සඳහා ඔහු තවදුරටත් සුදුසු හා යෝග්‍ය තැනැත්තෙකු නොවන බවට මෙම සභාව යෝජනා කරයි.

පා. 125/'11

11.

ගරු රවී කරුණානායක මහතා

ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කුමරන් පද්මනාදන් අත්අඩංගුවේ තබාගෙන ඇත්තේ සහ ඔහුට එරෙහිව චෝදනා ගොනුකිරීමට අදහස් කරන්නේ කුමන නෛතික ප්‍රතිපාදන යටතේද යන්න සහ අනෙක් කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2009 අගෝස්තු 7 වැනි දින ශ්‍රී ලංකා රජයේ නිවේදනය ප්‍රකාරව, ෂන්මුගම් කුමාරන් ධර්මලිංගම් හෙවත් සෙල්වරාසා පත්මනාදන් හෙවත් කුමාරන් පත්මනාදන් හෙවත් "කේ.පී." නමින් වඩාත් ප්‍රකට පුද්ගලයා, දැනට වසරකට වැඩි කාලයක් රජයේ අත් අඩංගුවේ පසුවන හෙයින් ද,

ආයුධ ජාවාරම සහ සාපරාධී කුමන්ත්‍රණය කිරීම ඇතුළුව විවිධ චෝදනා සඳහා "කේ.පී." ජාත්‍යන්තර පොලීසියේ වඩාත් අවශ්‍ය පුද්ගල ලැයිස්තුවේ සිටින අයෙකු හෙයින් ද,

හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය රාජිව් ගාන්ධි මහතා 1991 දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් සහ ත්‍රස්තවාදී පනත සහ ඉන්දීය පුපුරණ ද්‍රව්‍ය පනත උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ඉන්දීය ආයතනයන්ට ද ඔහු අවශ්‍ය පුද්ගලයෙකු හෙයින් ද,

ශ්‍රී මහා බෝධියට සහ දළදා මාළිගාවට එල්ලවූ ප්‍රහාර ඇතුළුව ශ්‍රී ලංකාවේ සිදුවූ ත්‍රස්ත ප්‍රහාර කිහිපයකට ඍජුව හා වක්‍රව යන දෙයාකාරයෙන්ම ඔහු සම්බන්ධ වී ඇතැයි පැවසෙන හෙයින් ද,

ඔහු දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) වෙනුවෙන් ආයුධ මිල දී ගත් තැනැත්තා වූ හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ආයුධ ප්‍රතිසම්පාදන, සැපයුම් දාම සහ මුදල් විශුද්ධිකරණ මෙහෙයුම්වල නිරත වූ ඔහු එහි ගෝලීය කාර්යාල ජාලයක් පවත්වාගෙන ගිය හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි ආයුධ නැව් මගින් ප්‍රවාහනය කිරීමේ නියැලුණු නැව් සමාගමක් ඔහු විසින් මෙහෙයවූ බව හෙළිවී ඇති හෙයින් ද,

ශ්‍රී ලංකාවේ බැංකු මංකොල්ල කිහිපයක් ඔහු විසින් මෙහෙයවූයේ යැයි ද පැවසෙන හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි තොග සම්පාදනය කිරීමේ ඔහු නියැළී ඇති හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අයත් නැව් 19ක් සහ රන් රිදී තොග ඇතුළු අති විශාල වත්කම් සම්භාරයක් ඔහු පාලනය කරන්නේ යැයි පැවසෙන හෙයින් ද, 2009 ජූලි 21 වැනි දින එල්.ටී.ටී.ඊ. සංවිධානය නිකුත් කළ නිවේදනයකින් ඔහු එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායකයා බව ප්‍රකාශ කළ හෙයින් ද,

අහිංසක ජනයා ඝාතනය කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය දරුණු ම්ලේච්ඡ ක්‍රියා සිදු කළ බව එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයක සඳහන් වන හෙයින් ද, එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම් සඳහා මූල්‍යාධාර ලබාදීම සඳහා ජාත්‍යන්තරව මුදල් එකතු කළ පුද්ගලයා "කේ.පී." බව රජය පවසන හෙයින් ද,

පහත දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අ) "කේ.පී." අත් අඩංගුවේ රඳවා තබාගෙන ඇත්තේ කුමන නෛතික ප්‍රතිපාදන යටතේද;

(ආ) "කේ.පී." ට එරෙහිව චෝදනා ගොනු කිරීමට අදහස් කරන්නේද, එසේ නම්, —

- (i) ඔහුට නඩු පවරනුයේ කුමන නීතිය යටතේද;
- (ii) චෝදනා පත්‍රයේ අන්තර්ගත කරන වැරදි කවරේද;
- (iii) ඔහුට එරෙහිව චෝදනා ගොනුකිරීමට අදහස් කරනුයේ කවදාද; සහ
- (iv) එම චෝදනා ගොනු කරනුයේ කවර අධිකරණයේද;

(ඇ) ඔහු වෙනත් රටකට බාරදිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් වී තිබේද, එසේ නම්, එබඳු ඉල්ලීම් කර ඇත්තේ කවර රටවල්ද සහ ඔහු වෙනත් රටකට බාරදීම සඳහා යෝජනා වී තිබේද;

(ඈ) රන් රිදී තොග සහ නැව් කෙරෙහි විශේෂ අවධානය සහිතව, "කේ.පී." සන්තකයේ තිබූ එල්.ටී.ටී.ඊ. වත්කම්වල ඉරණම සහ පිහිටීම;

(ඉ) රටේ නීතිය යටතේ ඔහුට එරෙහිව කටයුතු නොකර "කේ.පී." රඳවාගෙන සිටීමෙන්, කිසියම් නිලධාරියෙකු හෝ නිලධාරීහු ද්‍රෝහී හැසිරීම සහ රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරුවන් වන්නේද යන ප්‍රශ්නය පිළිබඳව ද විශේෂ කාරක සභාව සිය අවධානය යොමු කළ යුතුය.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා.135/'11

12.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු අනෝමා ගමගේ මහත්මිය

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු දයාසිරි ජයසේකර මහතා,— හෙජින් ගිවිසුම් මත ලංකා ඛනිජතෙල් සංස්ථාවට සිදුවූ අවාසිය හා අලාභය සහ එම ගිවිසුම් සඳහා වගකිව යුතු පුද්ගලයින්ට විරුද්ධව ගත යුතු පියවර පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ කළමනාකාරීත්වයේ පූර්ණ අකාර්යක්ෂමතාවයේ ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට එරෙහිව ලබා දී ඇති අධිකරණ තීරණයක් ප්‍රකාරව ඇමරිකානු ඩොලර් මිලියන 160 ක මුදලක් ගෙවීමට ඇති හෙයින් ද,

සංස්ථාවට එරෙහිව තීන්දු වුවහොත් පිළිවෙළින් ඇමරිකානු ඩොලර් මිලියන 60ක් හා ඇමරිකානු ඩොලර් මිලියන 200ක් සංස්ථාව විසින් ගෙවිය යුතු නඩු දෙකක් මේ වන විට විභාග වෙමින් පවතින හෙයින් ද,

නිසි සැලසුමකින් හා සොයාබැලීමකින් තොරව මෙම හෙජින් ගිවිසුම්වලට එළඹෙන ලද්දේ හුදු අකාර්යක්ෂමතාවය හේතුවෙන්ද, නැතහොත් වංකභාවය හේතුවෙන්ද යන්න පැහැදිලි නැති හෙයින්ද,

(අ) ලංකා ඛනිජ තෙල් සංස්ථාවට මුළුමනින්ම අවාසිදායක වන එවන් හෙජින් ගිවිසුම්වලට එළැඹෙන ලද්දේ කෙසේද;

(ආ) එම ගිවිසුම් පිළිබඳව වගකිව යුතු සංස්ථා නිලධාරීන් කවුරුන්ද;

(ඇ) හෙජින් ගිවිසුම් හේතුවෙන් සංස්ථාවට සිදුවූ මුළු පාඩුව කොපමණද;

(ඈ) ඉදිරියේදී එවන් සිදුවීම් ඇතිවීම වැළැක්වීම සඳහා ගත යුතු පියවර කවරේද;

(ඉ) හෙජින් ගිවිසුම් පිළිබඳව වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව ගත යුතු පියවර කවරේද; හා

(ඊ) ප්‍රස්තුත කරුණට යම් සම්බන්ධතාවයක් හෝ අදාළත්වයක් ඇතැයි කාරක සභාව තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව ද,

පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය,

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

(4) සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින්වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා.136/’11

13.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු  මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු  සුජීව සේනසිංහ මහතා

ගරු  වසන්ත අලුවිහාරේ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  තිස්ස අත්තනායක මහතා

ගරු  දයාසිරි ජයසේකර මහතා,— ලංකා ඛනිජතෙල් සංස්ථාව විසින් බාල තත්ත්වයේ පෙට්‍රල් ආනයනය කරන ලද්දේ කවර ආකාරයෙන්ද යන්න, සංස්ථාවට සිදුවූ සම්පූර්ණ අලාභය සහ ගැටලුවට හේතුවූ ආනයනයන් සඳහා වගකිව යුතු පුද්ගලයන්ට විරුද්ධව ගත යුතු පියවර පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

මෑත අතීතයේදී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පරිපාලනය සම්පූර්ණයෙන්ම දුර්වලව පැවති බව පෙනී ගොස් ඇති හෙයින්ද,

සංස්ථාව තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් ආනයනය කර ඇති බව දැන් හෙළිදරව් වී ඇති හෙයින් ද,

මෙම තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් නිසා වාහන දහස් ගණනකට හානි සිදුවී ඇති අතර, ඇතැම් වාහනවලට අලුත්වැඩියා කිරීමට නොහැකි තරමටම හානි සිදුවී ඇති හෙයින් ද,

ඉන්ධන පිරවුම්හල් ගණනාවක සවිකර ඇති පෙට්‍රල් පොම්ප ගණනාවකටද හානි සිදුවී ඇති හෙයින් ද,

සංස්ථාවේ මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් මිනිය නොහැකි තරමේ මූල්‍යමය පාඩු සිදුවී ඇති හෙයින් ද,

බලධාරීන් දැනටමත් වරද පැටවීමට තැනැත්තෙකු සොයාගෙන ඇති හෙයින් ද,

තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් සත්‍ය වශයෙන්ම ආනයනය කළ බව අමාත්‍යවරයා පිළිගෙන ඇති හෙයින් ද,

මෙම නින්දා සහගත ප්‍රතිඵලය සම්බන්ධයෙන් රජය පරස්පර විරෝධී ප්‍රකාශ ගණනාවක් කර ඇති හෙයින් ද,

(අ) මෙම ඛනිජ තෙල් තොගය ඇණවුම් කිරීමේදී ටෙන්ඩර් පටිපාටි අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(ආ) සංස්ථාව විසින් තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් සත්‍ය වශයෙන්ම ආනයනය කරනු ලැබුවේද;

(ඇ) එම ආනයනයන් කරන ලද්දේ කවර රටකින්ද;

(ඈ) එම ආනයනයන්හි සම්පූර්ණ පිරිවැය කොපමණද;

(ඉ) එබඳු ආනයනයන් හේතුවෙන් සංස්ථාවට සිදුවූ මුළු අලාභය කොපමණද;

(ඊ) එබඳු ආනයනයන් වැළැක්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(උ) පැමිණි තොග තත්ත්වයෙන් බාල බව හෙළිදරව් වූයේ නම්, ඒවා ප්‍රතික්ෂේප කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(ඌ) ආනයනය කරන ලද තොග තත්ත්වයෙන් බාල බව දැන සිටියදීත්, ඒවා රටේ පිරවුම්හල් ගණනාවකට බෙදාහරිනු ලැබීමට හේතු කවරේද;

(එ) ආනයනය කරන ලද තොග තත්ත්වයෙන් බාල බව හෙළිදරව්වීමෙන් පසුව එම තොග සඳහා ගෙවීම් කිරීමට හේතු කවරේද;

(ඒ) නියත වශයෙන්ම පෙට්‍රල් හිඟයක් ඇති විය හැකිව තිබූ බව ජනතාවට දැනුම් නොදීමට හේතු කවරේද;

(ඓ) එබඳු ආනයනයන් සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් කවුරුන්ද;

(ඔ) ඉදිරියේදී එබඳු සිදුවීම් වැළැක්වීමට ගත යුතු පියවර කවරේද;

(ඕ) මෙම ආනයනයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද; සහ

(ඖ) ප්‍රස්තුත කරුණුවලට සම්බන්ධ හෙයින් විමසා බැලීම යෝග්‍ය යැයි කාරක සභාවට හැඟෙන අන් කවර හෝ කරුණු,

පරීක්ෂා කර බැලීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය,

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

(4) සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 137/'11

14.

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ඩිව් ගුණසේකර මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු රාජීව විජේසිංහ මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ ජනතාව එකම දේශයක ජනතාවක් ලෙස සවිබල ගැන්වීම පිණිස දේශපාලන හා ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග නිර්දේශකර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

රටෙහි සහ එහි වැසියන්ගේ ආර්ථික, සාමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා ජාතියක් ලෙස එකමුතු වීමට සහ කටයුතු කිරීමට ශ්‍රී ලාංකික ජනතාවට අද්විතීය අවස්ථාවක් උදාවී ඇති හෙයින්ද,

මෙම කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ජනතාවගේ සමගිය ප්‍රවර්ධනය කිරීමට සහ ඔවුන්ගේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන සංවර්ධනය සඳහා තීරණ ගැනීමට ඔවුන් සවිබල ගැන්වීම සඳහා පියවර ගැනීම කාලෝචිත හෙයින්ද,

පූර්වෝක්ත කරුණු සඳහා හැකියාව ලබා දීමට ගතයුතු පියවරවල ස්වභාවය හා විෂය පථය නිර්ණය කිරීම සඳහා වඩාත් සුදුසුකම් ඇත්තේ ජනතාවගෙන් තේරී පත්වූ නියෝජිතයන්ගේ කමිටුවක්වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශේෂ කාරක සභාවකට හෙයින්ද,

(අ) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහාත්,

(ආ) එකම දේශයක ජනතාවක් ලෙස ඔවුන් තවදුරටත් සවිබල ගැන්වීම සඳහාත්, සහ

(ඇ) ඔවුන්ගේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා තීරණ ගැනීම සහ ක්‍රියාමාර්ගවල නියැළීමට ඔවුනට හැකියාව ලබා දීම සඳහාත් වූ,

ශ්‍රී ලංකාවේ ජනතාවට යෝග්‍ය හා පිළිගතහැකි විසඳුමක් සඳහා වූ දේශපාලන හා ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග මෙම ගරු සභාවට මාස 06ක් ඇතුළත නිර්දේශ කිරීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති, කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, කාරක සභාව සාමාජිකයින් තිස් එක් (31) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එකී කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියමකර ගැනීමටත්;

(ආ) එය අවශ්‍ය යැයි සලකන ඕනෑම පුද්ගලයෙකු හෝ ලේඛනයක් කැඳවීමත්;

(ඇ) එසේ කැඳවනු ලබන ඕනෑම පුද්ගලයෙකු දිවුරුම් හෝ ප්‍රතිඥා මත ප්‍රශ්න කිරීමටත්;

(ඈ) කලින් කල පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමටත්;

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටත්;

බලය තිබිය යුතු ය.

පා.149/’11

15.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු මොහමඩ් අස්ලම් මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු රුවන් රණතුංග මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු සරණ ගුණවර්ධන මහතා

ගරු ජගත් බාලසූරිය මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු අචල ජාගොඩගේ මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කනක හේරත් මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ගාමිණී විජිත් විජිතමුණි ද සොයිසා මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු ෆීලික්ස් පෙරේරා මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු එම්. බී. ෆාරුක් මහතා

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මහතාට එරෙහිව බලය අයථා භාවිතය පිළිබඳවත්, විෂමාචාරය සහ/හෝ අවකල් ක්‍රියාව පිළිබඳවත් වූ චෝදනා පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

එවැනි චෝදනාවලට අනුව ඔහු අධිකරණය අපකීර්තියට පත්කොට ඇති බව සඳහන් වන බැවින්ද,

අධිකරණයේ ස්වාධීනත්වය හා නීතියේ රීතිය ආරක්ෂා කිරීමට හා පවත්වාගෙන යැමට ඔහු අපොහොසත්වූ බැවින්ද,

පහත සඳහන් කරුණු විමර්ශනයට ලක්කොට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු බවට මේ පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අ) වැල්ලවාය හිටපු මහේස්ත්‍රාත් ජනක බණ්ඩාර මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ ඉල්ලා අස්වීම ඉදිරිපත් කිරීම පිණිස ඔහුට බලපෑම් එල්ල කරනු ලැබුවේද යන වග,

(ආ) කොළඹ, හිටපු අතිරේක මහේස්ත්‍රාත් හිරාන් ඒකනායක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය ද්වේෂ සහගත ලෙස අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඇ) හිටපු මහේස්ත්‍රාත් සුනිල් ලෝරන්ස් ද කොස්තා මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඈ) මාතර හිටපු අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර අනුර බණ්ඩාර මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඉ) මාළිගාකන්ද හිටපු මහේස්ත්‍රාත් ඩී. එම්. සිරිවර්ධන මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඊ) මීගමුව හිටපු දිස්ත්‍රික් විනිශ්චයකාර පාලිත බණ්ඩාරනායක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(උ) නුවරඑළිය හිටපු දිස්ත්‍රික් විනිශ්චයකාර ප්‍රභාත් ද සිල්වා මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඌ) කැබිතිගොල්ලෑව හිටපු මහේස්ත්‍රාත් ඩී. එම්. ටී. බී. දිසානායක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(එ) කොළඹ, හිටපු අතිරේක මහේස්ත්‍රාත් හැරල්ඩ් විජේසිරි ලියනගේ මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඒ) මොරවක හිටපු මහේස්ත්‍රාත් කේ. ඩී. ඩී. කේ. ද ආබෘ මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඔ) බලපිටිය, හිටපු මහේස්ත්‍රාත් වයි. එල්. ධර්මසේන මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඕ) මහනුවර, හිටපු අතිරේක මහේස්ත්‍රාත් නන්දන වීරසිංහ මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ක) කන්තලේ හිටපු මහේස්ත්‍රාත් ඒ. එම්. ඩී. එස්. දික්කපිටිය මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ග) ඇල්පිටිය හිටපු දිස්ත්‍රික් විනිශ්චයකාර ජී. ඩී. කුලතිලක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ච) ඉහත සඳහන් අවස්ථාවලට අමතර වශයෙන් අධිකරණ සේවයේ නිලධාරීන්ගේ සේවාවන් ද්වේෂසහගත ලෙස අවසන් කරනු ලැබූ අවස්ථාවන්;

(ජ) කොළඹ 7, විජේවර්ධන මාවතේ අංක 129 දරන ස්ථානයේ පිහිටි අග්‍රවිනිශ්චයකාර නිල නිවසේ පවත්වා ගෙන යමින් තිබූ විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ භාරකරු වශයෙන් අධිකරණය ඉදිරියේ චෝදනා ගණනාවක් එල්ලවී තිබූ රෝහණ කුමාර නමැති පුද්ගලයකුට ගරු සරත් එන්. සිල්වා මහතා විසින් පත්වීමක් ලබා දුන්නේද යන වග;

(ට) ගරු සරත් එන්. සිල්වා මහතා ගරු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවය කරනු ලබන බෞද්ධ ගුවන්විදුලි සේවාව ස්ථාපනය කරනු ලැබීමට තුඩුදුන් කරුණු සහ ද බුඩිස්ට් රූපවාහිනී නාලිකාව (The Buddhist TV Channel) ආරම්භ කිරීමට රුපියල් මිලියන 65ක ප්‍රදානයක් ලබා දුන් මුහුන්තන් කානගී පෙත්සම්කරු වශයෙන් පෙනී සිටි සී. බී. එන්. චන්ද්‍රිකා (CBN Sat) නඩුවේ තීරණයට අදාළ කරුණු;

(ඩ) පාර්ලිමේන්තුව නවීකරණය කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධනය පිළිබඳ ලෝක බැංකු/එජාස වැ. (World Bank/ UNDP) ආධාර ව්‍යාපෘතියේදී ගරු සරත් එන්. සිල්වා මහතා විසින් ඉටු කරන ලද කාර්යභාරයට අදාළ කරුණු;

(න) අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් ගරු සරත් එන්. සිල්වා මහතා සේවය කරන ලද කාල සීමාව ඇතුළත ඔහුගේ ද්වේශසහගත ක්‍රියා හේතුවෙන් වෙනත් කිසියම් පුද්ගලයන්ට අගතියක්ද සිදුවී ඇත්ද යන වග.

(2) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකවරයා විසින් නම් කළයුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධි විධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් තිස්එක් දෙනෙකුට (31) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එකී කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද,

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමටද, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමටද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමටද

බලය තිබිය යුතුය.

පා. 150/'11

16.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු අනෝමා ගමගේ මහත්මිය

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා,— 2011 දෙසැම්බර් මස 1 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව මගින් අවධානයට ලක්කර තිබෙන රජයට අයත් ව්‍යාපාරවල පාඩු පිළිබඳව පරීක්ෂාකර ඒවාට වගකිව යුතු අයට එරෙහිව ගත යුතු පියවර හා ඒවා නිවැරදි කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශකර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති හා මානව සම්පත් අමාත්‍ය ගරු ඩිව් ගුණසේකර මහතා විසින් 2011 දෙසැම්බර් මස 1 වැනි දින ඉදිරිපත් කරන ලද හෙයින්ද;

රජයට අයත් පාඩු ලබන ආයතන සහ ව්‍යාපාර ගණනාවක් එම වාර්තාව මගින් අවධානයට ලක්කර ඇති හෙයින්ද;

එම ආයතන අතර වඩාත් කැපී පෙනෙන්නේ පහත සඳහන් ආයතන හෙයින්ද;

1. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
2. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
3. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
4. ශ්‍රී ලංකන් ගුවන් සේවය
5. සීමාසහිත මිහින් ලංකා සමාගම
6. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
7. මාර්ග සංවර්ධන අධිකාරිය සහ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය බංකොලොත්භාවයට පත් වී ශ්‍රී ලංකා රජය විසින් එම තත්ත්වයෙන් මුදවා ගත යුතුව පවතින බවද හෙළිදරව් වී ඇති හෙයින්ද;

මෙම පාඩු ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය තද බල ලෙස පිරිහීමට හේතුවන හෙයින්ද;

මෙම ආයතන පවත්වාගෙන යාමේ හා ඒවා පත්ව ඇති තත්ත්වයෙන් මුදවා ගැනීමේ පිරිවැය අවසානයේදී දැරීමට සිදුවන්නේ මහජනතාවට වන හෙයින් සහ

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව කෙරෙහි පැවරී ඇති බලතල, එය වාර්තා ඉදිරිපත් කිරීමට පමණක් සීමා කරන අතර තමන් හෙළිදරව් කරගන්නා ලද කරුණු සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමේ භූමිකාවක් එය සතුව නොමැති හෙයින් ද;

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ පිළිබිඹු කෙරෙන මෙම ආයතනවල, විශේෂයෙන්ම මෙහි ලැයිස්තුගතකර ඇති ආයතනවල කටයුතු සොයාබලා ඒවා පාඩු ලැබීමට හේතු නිශ්චය කිරීම සඳහා ද;

(ආ) යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් මෙම ආයතනවල කළමනාකරණය සඳහා වගකිව යුතු ද යන්න සහ වංචා සහගත ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිටී ද යන්න නිශ්චය කිරීම සඳහා ද;

(ඇ) මෙම පාඩු දිගින් දිගටම සිදුවීම වැළැක්වීම සඳහා ද;

(ඈ) වගකිව යුත්තන්ට දඬුවම් කිරීම පිණිස මුල් අවස්ථාවේදී ගතයුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා ද;

(ඉ) මෙම පාඩු පියවා ගැනීම සඳහා ගත යුතු පියවර තීරණය කිරීම සඳහා; සහ

(ඊ) පාර්ලිමේන්තු අයවැය කාර්යාංශයක් ස්ථාපනය කිරීම ඇතුළුව, වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය අතිරේක නීති කවරේද යන්න නිශ්චය කිරීම සඳහා ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමටද, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමටද, එබඳු තැනැත්තෙකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපි ලේඛන, පොතක්, ලේඛනයක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීම මගින් සත්‍ය අසත්‍යතාව විමසීමෙන් හෝ අන්‍යාකාරයකින් තහවුරු කරගැනීමටද, කාරක සභාවේ සභාපතිවරයා හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ හෝ ප්‍රතිඥා දීමට සලස්වනු ලැබූ සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීමටද;

(ඈ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කලට අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතු ය.

4. කාරක සභාව, එහි පළමු රැස්වීමේ සිට එක් වර්ෂයක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නියම කෙරෙන වෙනත් හෝ වැඩිමනත් කාලයක් තුළ සිය වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

පා. 156/'12

17.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— 2011 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සම්බන්ධ ගැටලු පරීක්ෂා කර බලා ඒවා නිරාකරණය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිකර්ම නිර්දේශ කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2011 අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම බරපතළ ගැටලු ඇති කොට ඇති හෙයින්ද;

විවිධ පාර්ශ්ව විසින් පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කරමින් ඇති හෙයින්ද;

ගැටලු ඇති වී ඇත්තේ තාක්ෂණික දෝෂ හේතුවෙන් බව සමහර පාර්ශ්ව ප්‍රකාශ කරන හෙයින්ද;

ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අනවශ්‍ය හදිසිය සම්බන්ධයෙන් තවත් සමහර අය චෝදනා කරන හෙයින්ද;

අදාළ නිලධාරීන්ගේ අකාර්යක්ෂමභාවය නිසා ගැටලු මතුවී ඇතැයි තවත් සමහරු චෝදනා කරන හෙයින්ද;

විභාග කොමසාරිස්වරයා ස්වකීය ධූරයෙන් මුදා හැර ඇති හෙයින්ද;

මෙම කාරණය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට ජනාධිපතිවරයා තමා විසින්ම කොමිසමක් පත් කර ඇති හෙයින්ද;

සමස්ත ශිෂ්‍ය පරම්පරාවකම අනාගතය විපතට පත් කර ඇති හෙයින්ද;

අධ්‍යාපන පද්ධතිය පිළිබඳ විශ්වාසය දැඩිලෙස බිඳවැටීමට මෙය හේතු වී ඇති හෙයින්ද;

අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සහතික පිළිගැනීම සම්බන්ධයෙන් සැක මතුව ඇති හෙයින්ද;

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි:—

(අ) Z ලකුණු ක්‍රමය සහ එය ක්‍රියාත්මක කරන ආකාරය පරීක්ෂා කිරීමට;

(ආ) මෙම ගැටලුවට පාදක වූ හේතු පරීක්ෂා කිරීමට;

(ඇ) 2011 වර්ෂය සඳහා වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල පිළිබඳ ගැටලු නිරාකරණය කර ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට;

(ඈ) එවැනි ගැටලු අනාගතයේදී ඇති වීම වළකාලීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීමට; සහ

(ඉ) කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරන්නා වූ වෙනත් ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළයුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධි විධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසිඑක් දෙනෙකුට (21) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකු කැඳවීමටද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමටද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යැයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්‍ෂා කිරීම මගින් සත්‍ය අසත්‍යතාව විමසීමෙන් හෝ අන්‍යාකාරයකින් තහවුරු කරගැනීමටද, කාරක සභාවේ සභාපතිවරයා හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ හෝ ප්‍රතිඥා දීමට සලස්වනු ලැබූ සාක්‍ෂිකරුවන් පරීක්‍ෂා කිරීමටද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමටද

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් වාරයේ සිට වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් අවසර ලබා දෙන එවැනි වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

18.

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු මංගල සමරවීර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු අනෝමා ගමගේ මහත්මිය

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා

ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු දුනේෂ් ගන්කන්ද මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

මේ රටේ රැකියා විරහිත උපාධිධාරීන් අද වන විට 40,000කට වැඩි ප්‍රමාණයක් සිටින හෙයින් ද;

මෙම රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රජයේ රැකියා ලබා දීමේදී විධිමත් සහ සාධාරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවන හෙයින්ද;

රජය විසින් රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා සැපයීමේදී දේශපාලන හිතවත්කම්, පවුල් සම්බන්ධතා, වෙනත් ඥාති සම්බන්ධකම් මත මෙකී පිරිසට රැකියා ලබා දීම සඳහා කටයුතු කරගෙන යනු ලබන හෙයින් ද;

"දේශපාලන ලැයිස්තු" මගින්, රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රජයේ රැකියා ලබා දීම අසාධාරණ, අවිධිමත් සහ රජයේ රැකියාවලට බඳවා ගැනීමේ පිළිගත් පරිපාටිය සහමුලින්ම උල්ලංඝනය කරනු ලැබ ඇති හෙයින් ද;

දේශපාලන පක්ෂපාතීත්වය සලකා රජයේ රැකියා ලබාදීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් කඩවී ඇති හෙයින් ද;

රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මයන්හි 27(2)(අ) ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් සැබෑ ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම රජය වෙත භාර කර ඇති හෙයින් ද;

මෙසේ රැකියා ලබා දීමට හේතු වූ කරුණු කාරණා සම්බන්ධයෙන් සාධාරණ කරුණු දැක්වීමක් කිරීමට අදාළ අමාත්‍යවරයා අපොහොසත් වී ඇති හෙයින් ද;

රැකියා විරහිත උපාධිධාරීන්ට මෙසේ සැලකීම, මේ රටේ තරුණ සම්පත නිකරුණේ දේශපාලනඥයින් පසුපස යන පිරිසක් බවට පත් කිරීමේ මූලික අරමුණ ඇතිව ක්‍රියාත්මක වන්නක් බවට සැලකිය හැකි හෙයින් ද;

රාජ්‍ය සේවයට සීමිත තරග විභාගවලින් රාජ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේදී තරග විභාග ප්‍රතිඵල ප්‍රසිද්ධ නොකරමින් සම්මුඛ පරීක්ෂණ මගින් ඔවුන් බඳවාගෙන පසුව ප්‍රතිඵල නිකුත් කිරීම මගින් රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳව කිසිදු විනිවිදභාවයක් නොමැතිවීමෙන් රටේ අති බහුතරයකින් යුත් උගත් තරුණ පරපුරට අසාධාරණයක් වන හෙයින්; සහ

රාජ්‍ය නිලධාරීන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, පිළිබඳව ඇති ස්වාධීන රාජ්‍ය ආයතනය වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්වාධීන ලෙස ක්‍රියාත්මක කරවීමට ඇති ඉඩකඩ අහුරා ඇති හෙයින් ද;

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා කෙරෙහි සභාවේ විශ්වාසය භංගවී ඇති බව මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පා. 168/'12

19.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ග්‍රීක බැඳුම්කරවලින් කරන ලද ආයෝජනයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

වගකීමෙන් තොර දේශීය ආර්ථික කළමණාකරණය විසින් වඩාත් අයහපත් තත්ත්වයට පත්කරන ලද, ගෝලීය මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් වශයෙන් යුරෝපා කලාපයේ ආර්ථිකයන් කිහිපයක්ම 2010 වර්ෂයේදී පමණ අර්බුදකාරී තත්ත්වයට ඇද වැටුන හෙයින්ද;

ග්‍රීසිය සිය ඇස්තමේන්තුවලට වඩා බෙහෙවින් පහළට වැටුණු වර්ධන වේගයක්ද, විශාල පරතරයකින් බදු ආදායමට වඩා අධික වූ වියදම් සමග ගොඩනැගුනු රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවන්ද, පාලනය කළ නොහැකි ලෙස ඉහළ යමින් ඇති ණය බරද, රජය සිය අයවැය පරතරය පිළිබඳව මවා පෑ අගයන් ලබාදෙමින් යුරෝපා සංගමය නොමග යැවූ බව අනාවරණය වීමෙන් පසුව විශ්වාසය තැබිය හැකි බව සහමුලින්ම පාහේ ගිලිහී ගිය නිල සංඛ්‍යා දත්තද හේතුවෙන් වඩාත් හානියට පත් වූ රටවලින් එකක් බවට පත් වූ හෙයින්ද;

2010 ප්‍රථම කාර්තුව වනවිට ග්‍රීක රජයට සිය ණය ආපසු ගෙවීම සඳහා වූ බැඳීම් සපුරාලීමට ඇති හැකියාව බරපතල ප්‍රශ්නයකට භාජනය වී රාජ්‍ය ණය ආපසු ගෙවීම පැහැර හරිනු ඇතැයි යන බිය ඇති කළ හෙයින්ද;

ශ්‍රේණිගත කිරීමේ ආයතන ග්‍රීක ණයවලට "නොවටිනා" යන තරාතිරම ලබා දී, එමගින් ග්‍රීසිය වෙත ලබා දෙන පුද්ගලික ණය සම්පූර්ණයෙන්ම සිඳී තිබූ හෙයින්ද;

2010 අප්‍රේල් මාසයේදී ග්‍රීක රජය ආර්ථික ගොඩගැනීමේ ණයක් සඳහා අයැදුම් කළ අතර, ආර්ථිකය තව තවත් අයහපත්වීම නවතාලීමේ අපේක්ෂාවෙන්, දෘඪතර අරපිරිමැස්මකින් කටයුතු කිරීම සඳහා වූ යෝජනාවලියක්ද කොන්දේසි වශයෙන් පනවමින්, යුරෝපා කලාපයේ රටවල් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒකාබද්ධව අරමුදල් සපයන ලද, යූරෝ බිලියන 110ක ආධාරයක් අනුමත කරනු ලැබූ හෙයින්ද;

මුදල් අංශයෙන් කිසිදු සුනම්‍යතාවයක් නොමැති වීම හේතුවෙන් ග්‍රීක රජයට එම දැඩි මූල්‍ය පාලන කොන්දේසි අනුව කටයුතු කිරීමට නොහැකි වීම නිසා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ගයන් ජනතාවට වීදි බැස කැරලි ගැසීමට සැලැස්වූ හෙයින්ද;

ග්‍රීක ආර්ථිකය ඇද වැටීම දිගින් දිගටම සිදු වෙමින්, ග්‍රීක ණය පිළිබඳ විශ්වාසය කැපී පෙනෙන ලෙස අඩු වී, එමගින් රාජ්‍ය ණය ආපසු ගෙවීම පැහැර හරිනු ඇතැයි යන අපේක්ෂාව තවත් ඉහළ නැංවූ හෙයින්ද;

2011 මාර්තු මාසයේදී "මූඩි" නමැති ආයතනය විසින් ග්‍රීක ණය "නොවටිනා" යන ප්‍රභේදයේ ගැඹුරටම ඇද දමා, එයට ඉහළ අවදානමක් සහිත ශ්‍රේණියක් ලබා දෙමින්, සෘණාත්මක ස්වරූපයක් ලබා දුන් හෙයින්ද;

මෙම ප්‍රවණතාවයත් සමග ආයෝජකයින් සීඝ්‍රයෙන් ග්‍රීක බැඳුම්කර "වටිනාකමකින් තොර කඩදාසි" ලෙස බැහැර කිරීම සහ ග්‍රීක රජයට අරපිරිමැස්මෙන් කටයුතු කිරීමේ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා, යුරෝපා කලාපයේ රටවල් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒකාබද්ධව ලබාදෙන ආර්ථිකය ගොඩගැනීමේ ආධාර මුදල ඇණ හිටීමෙන් නුදුරේ එන රාජ්‍ය ණය ආපසු ගෙවීම පැහැර හැරීමේ තත්ත්වය නිසා ග්‍රීක බැඳුම්කරවලට ඉදිරිපත් කෙරෙන ප්‍රතිලාභ ඉහළ යාම ඇරඹුණු හෙයින්ද;

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 2011 අප්‍රේල් මස මුල් භාගයේදී විශාල අලාභයක් ඇතිවීමේ අවදානම ඇතිව යූරෝ මිලියන 22ක් ග්‍රීක බැඳුම්කරවල ආයෝජනයකර ඇතැයි පැවසෙන හෙයින් ද;

ග්‍රීක බැඳුම්කර සමහරක් පාඩුපිට විකිණීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට විශාල අලාභයක් සිදුව ඇති බවට පුවත්පත් හෙළිදරව් කිරීමෙන් අනතුරුව, 2012 ජූලි 17 වැනි දින මෙය පාර්ලිමේන්තුවේ මතු කළ හෙයින් ද;

එය සත්‍යයක් නම්, ආයෝජනයන්හි විස්තර සහ විශේෂයෙන්ම මූල්‍ය මණ්ඩලයේ කැමැත්තෙන් තොරව එබඳු ආයෝජනයක් සිදුකළේ මන්දැයි අමාත්‍යතුමාගෙන් විමසා සිටි හෙයින් ද;

එම ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, අප්‍රේල් මස මුල් භාගයේදී මහ බැංකුව ඇත්ත වශයෙන්ම ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කර ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව පිළිබඳ අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ප්‍රකාශ කළ හෙයින් ද;

එම ආයෝජනය සාධාරණීකරණය කරමින් "එම තීරණයට (ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කිරීමට) බලපානු ලැබුයේ එම කාලය වනවිට (2011 අප්‍රේල් 05) යුරෝපයේ පැවති, මූල්‍ය ස්ථාවරත්ව පැකේජයක් මගින් සහය දෙනු ලැබූ අර්බුද කළමනාකරණය සඳහා වූ ශක්තිමත් රාමුවක් පැවතීම නිසා" බව ගරු අමාත්‍යතුමා පැවසූ හෙයින් ද;

"එබැවින් එම අවස්ථාව වනවිට ග්‍රීසිය බේරාගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අධිකාරීන් විසින් නිර්මාණයකර තිබූ මෙම විශාල අරමුදල පැවතියේය. එහෙයින් අවස්ථානුගත කරුණු යටතේ, අවදානම සැලකිය යුතු ලෙස අඩු සහ දරාගත හැකි යැයි සලකන ලදී." යනුවෙන් ගරු අමාත්‍යතුමා තවදුරටත් සඳහන් කළ හෙයින් ද;

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා සිදුකළ උක්ත ප්‍රකාශය අසත්‍ය බව පෙනී ගොස් ඇති හෙයින් ද;

ග්‍රීක බැඳුම්කරවල අවදානම සැලකිය යුතු ඉහළ සහ ගෙවීම් පැහැර හැරීම අත්‍යාසන්න වූ හෙයින් ද;

ග්‍රීක බැඳුම්කරවල ඉහත කී ආයෝජනය සිදුකළ කාල වකවානුව වනවිට එම රට සමග යුරෝපීය මූල්‍ය ස්ථාවරත්ව පහසුකම (EFSF) පිළිබඳ සැලැසුමක් නොතිබූ හෙයින් ද;

යුරෝපීය මූල්‍ය ස්ථාවරත්ව පහසුකම මගින් ග්‍රීසිය සිය මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා මූල්‍යාධාර ලබාගත්තේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පමණක් දෙවැනි වන්නා වූ "වරණිත ණය හිමියා" තත්ත්වය සහිත නිත්‍ය යුරෝපීය ස්ථාවර යාන්ත්‍රණයක් (ESM) බවට තාවකාලික යුරෝපීය මූල්‍ය ස්ථාවරත්ව පහසුකම (EFSF) පරිවර්තනය කරමින් තිබූ බැවින්, එය ශ්‍රී ලංකාවට වාසිදායක නොවන හෙයින් ද;

"වරණිත ණය හිමියා" තත්ත්වය යනුවෙන් අදහස්වන්නේ, වරණීය අනුපිළිවෙළ අනුව ගෙවීම් සිදුකිරීමේදී, යුරෝපීය ස්ථාවරත්ව යාන්ත්‍රණය (ESM)මගින් සිදුකළ ආයෝජනයන්ට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හැර අනෙකුත් සියලු පාර්ශවයන්ට වඩා ප්‍රමුඛතාව ලැබෙනු ඇතැයි යන බව හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකළ ආයෝජන නොගෙවා පැහැර හැරීමේ බරපතළ අනතුරක් පැවති හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව ආයෝජනය කළ අරමුදල් සැබෑ ලෙසම දැඩි අවදානමක පවතිද්දී, ඒවා සුරක්ෂිත බව හඟවමින් ගරු අමාත්‍යතුමා සභාව නොමග යවා ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව ග්‍රීක බැඳුම්කරවල සිදුකළ නොසැලකිලිමත් ආයෝජනයෙන් ඉක්බිතිවම, ග්‍රීක රජය යළිත්වරක් අසමත්ව, එහි ණය ශ්‍රේණිගත කිරීම ලොව අඩුම අගය දක්වා පහත හෙළු හෙයින් ද;

2011 ඔක්තෝබර් වනවිට, එහි ණය සියයට 50කට වැඩි ප්‍රමාණයකින් කපා හැරීමට ණය හිමියන් එකඟ වූ පාලිත ණය පැහැර හැරීමකට ග්‍රීසිය එළැඹී හෙයින් ද;

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ඉතිරිව පැවති ග්‍රීක බැඳුම්කරවල ආයෝජිත මුළු මුදලින් 53.5% (අධික වට්ටමක් සහිතව විකිණීමෙන් පසුවද) රටට විශාල අලාභයක් සිදු කරමින් අහිමි කර ගනු ලැබූ හෙයින් ද;

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව පිළිබඳ අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා 2012 ජූලි 17 දින කරන ලද ප්‍රකාශයේ සත්‍ය හෙළි නොකරමින් සහ එම ආයෝජනය සාධාරණීකරණය කරමින් "එම අවස්ථාවේ ග්‍රීසිය ආරක්ෂා කිරීමට ගෝලීය මූල්‍ය අධිකාරිය විසින් අරමුදලක් ඇති කළ බව" සහ එනිසා "එම අවදානම මධ්‍යස්ථ වශයෙන් අඩු සහ දරාගත

හැකි මට්ටමක පවතින බවට සළකණු ලැබූ බව'' හඟවමින්, හිතාමතාම සභාව නොමඟ යවා ඇති හෙයින්ද;

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ග්‍රීක බැඳුම්කරවල කරන ලද යූරෝ මිලියන 22ක ආයෝජන සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා සභාව නොමඟ යැව්වේද සහ සභාව නොමඟ යවා ඇත්තේ කොපමණ ප්‍රමාණයකට ද යන්න තීරණය කිරීමට; සහ

(ආ) එම අවස්ථාවන්හිදී ගත හැකි පියවර පිළිබඳව සභාවට නිර්දේශ කිරීමටත්,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකවරයා විසින් නම් කළ යුතුය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3.එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) පුද්ගලයන්, ලියවිලි සහ වාර්තා කැඳවීමටත්, යම් තැනැත්තෙකුට පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසත්, එම තැනැත්තන් සතුව හෝ ඔවුන්ගේ පාලනය යටතේ තිබෙන ලියවිලි, පොත්, සටහන් හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙසට විධාන කිරීමටත් බලය තිබිය යුතු ය.

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා හෝ ඒ සඳහා විශේෂයෙන් බලය පැවරූ නිලධාරියෙක් විසින් සිදුකරවන දිවුරුම් දීමක් හෝ ප්‍රතිඥා දීමක් මත සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම සහ සාක්ෂිකරුවන්ගේ වාචික පරීක්ෂණ මගින් තහවුරු කරගැනීම හෝ වෙනත් ලෙසකින් නිශ්චය කරගැනීමටද;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමටද;

(ඉ) එමෙන්ම කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමටද බලය තිබිය යුතු ය.

4. කාරක සභාව තම වාර්තාව කාරක සභාව පළමුවරට රැස්වූ දින සිට වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව ලබාදෙන එවැනි වෙනත් හෝ ඉදිරි කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය.

පා. 169/'12

20.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය,— 2012 නොවැම්බර් මස 09 වැනි දින සිදු වූ බන්ධනාගාර කැරැල්ල සම්බන්ධයෙන් විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2012 නොවැම්බර් මස 09 වැනි දින රාත්‍රී කාලයෙහි මහා පරිමාණයේ බන්ධනාගාර කැරැල්ලක් හටගත් අතර 2012 නොවැම්බර් මස 10 වැනි දින අලුයම කාලය දක්වා පැවති එම කැරැල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන් 30 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් මරණයට

පත්වී විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී ලෙස කටයුතු කළ නියෝජ්‍ය පොලිස්පතිවරයාද ඇතුළුව, ඒ හා සමාන පුද්ගලයන් සංඛ්‍යාවකට තුවාල සිදුවී ඇති හෙයින්ද;

බන්ධනාගාර තුළ මෙවැනි ආකාරයේ සිදුවීම් ඇති වූ පළමුවතාව මෙය නොවන හෙයින්; සහ

බන්ධනාගාර පද්ධතිය තුළ ඇති දූෂණ ක්‍රියා හේතුකොට ගෙන මෙම සිදුවීම් ඇති වී තිබෙන බව පෙනී යන හෙයින් ද;

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කොට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි.

(අ) මෙවර ඇති වූ කැරැල්ලට ආසන්නම හේතුව කවරේද;

(ආ) බන්ධනාගාර තුළ නිතර කැරලි ඇති වීමට හේතු සාධකවන කරුණු කවරේද;

(ඇ) බන්ධනාගාර තුළ විනය පවත්වා ගෙනයාම කෙරෙහි බලපාන දිගුකාලීන ගැටලු කවරේද;

(ඈ) මෙවැනි සිදුවීම් වළක්වාලීම සඳහා ගත යුතු කෙටිකාලීන හා දිගුකාලීන පියවර කවරේද;

(ඉ) කාරක සභාව විසින් අදාළ වේ යැයි සිතිය හැකි වෙනත් කිසියම් කරුණු ඇතොත් එම කරුණු;

2. (අ) මෙම කාරක සභාව සහ එහි සභාපති, කථානායකවරයා විසින් නම් කළ යුතුය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එකී කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද, එම පුද්ගලයා සතුව තිබෙන හෝ එම පුද්ගලයා භාරයේ පවතින කිසියම් ලියවිල්ලක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචික පරීක්ෂණවලට භාජනය කිරීම මගින් සාක්ෂිවල සත්‍ය අසත්‍යභාවය පරීක්ෂා කිරීමට හෝ අන්‍යාකාරයකින් ඒවා තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද පුද්ගලයෙක් විසින් සිදු කරවන දිවුරුම්දීමක් හෝ ප්‍රතිඥා දීමක් මගින් සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාව තම පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාල සීමාවක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබා දෙන එවන් වෙනත් හෝ වැඩිදුර කාලසීමාවක් තුළ තම වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

පා. 185/'13

21.

ගරු රවී කරුණානායක මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය කෙරෙහි විශ්වාස භංගත්වය,—

විදුලි ගාස්තු ඉහළ දැමීම සම්බන්ධයෙන් 2013 අප්‍රේල් මස 23 වැනි දින විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු ජෝන් අමරතුංග මහතා නගන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබාදෙමින් විදුලිබල සහ බලශක්ති අමාත්‍ය ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය මෙම විදුලි ගාස්තු ඉහළ දැමීමේ යෝජනාව එතුමිය මෙම තනතුර භාර ගැනීමට පෙර මෙම තනතුර හෙබවූ ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් සකස් කරන ලද බව අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කළ හෙයින් ද;

වත්මන් තාක්ෂණ, පර්යේෂණ සහ පරමාණුක බලශක්ති අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා 2013 අප්‍රේල් මස 24 වැනි දින නිකුත් කළ ප්‍රකාශයකින් විදුලි ගාස්තු ඉහළ නැංවීම පිළිබඳ තමාගේ කිසිදු වගකීමක් නොමැතිබව දක්වමින් ඉහත කාරණය පැහැදිලිව ප්‍රතික්ෂේප කර තිබූ හෙයින් ද;

එසේම, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මියගේ ප්‍රකාශය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට එතුමියට අභියෝග කරන තත්ත්වයකට එතුමා සිය ප්‍රකාශය කර ඇති හෙයින් ද;

විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමිය හිතාමතාම මෙම සභාව නොමග යවා ඇති බවත්, එසේ කිරීමෙන් මෙම සමස්ත සභාවේම සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩකිරීම සම්බන්ධයෙන් අමාත්‍යතුමිය වරදක් කර ඇති බවත් ඉතා පැහැදිලි වන හෙයින් ද;

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය විදුලිබල සහ බලශක්ති අමාත්‍ය තනතුරෙහි තවදුරටත් කටයුතු කිරීම සම්බන්ධයෙන් කිසිදු විශ්වාසයක් නොමැති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*